සබරගමුව පළාත් සභාව

සපරகமுவ மாகாண சபை

**SABARAGAMUWA PROVINCIAL COUNCIL**

*2017 ජූනි මස 13 අඟහරුවාදා දින*

***2017 ஜூன் மாதம் 13 ஆம் திகதி செவ்வாய்க்கிழமை* Tuesday**

***13 th June 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***

***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම ගරු අමාත්‍යතුමන්ලා, විපක්ෂනායකතුමා, ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාගෙන්ම අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන්ම තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

***ගරු සභාපති කංචන ජයරත්න***

***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

පාර්ලිමේන්තුවේ ආකෘතිය අනුව යමින් 6 වන පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප සහිත පුවරුවක් සකස් කර තිබෙනවා. 5 වන පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප සහිත පුවරුවේ කටයුතු අවසන් අදියරේ පවතිනවා. පළමු, දෙවන, තෙවන හා හතරවන පළාත් සභාවන්හි ඡායාරූප සහිත පුවරු ද කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා. එහිදී ආරම්භක පළාත් සභාවන් නියෝජනය කරන ලද සමහර ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඡායාරූප ලබා ගැනීමේ ගැටළු මතුවී තිබෙනවා. එම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. අපට ඒ පුවරුව සම්පූර්ණ කරගන්න සමහර ගරු මැති ඇමතිතුමන්ලාගේ ඡායාරූප සොයා ගැනීමේ දැඩි අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා. ඒ සොයා ගන්න අපහසුව තිබෙන ඒවා අපි ඔබතුමන්ලාට වාර්තා කරන්නම්. සහයෝගය ලබාදෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා තමුන්නාන්සේලා සියළුදෙනාගෙන්ම.

මීළඟට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉංජිනේරුවරයාගේ තාක්ෂණික සහයෝගය මත සභා ගර්භයේ ඔරලෝසු පද්ධතිය නිවැරදිව සකස් කර තිබෙනවා. එසේම සභා ගර්භය තුළ දී සභාවේ කාර්යය මණ්ඩලයේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා කැඳවීම් කිරීමට සභා මේසය මත සංඥා පද්ධතියක් සකස් කර තිබෙනවා. එම ස්විචය එබීම මඟින් කාර්ය මණ්ඩලයේ නිළධාරියෙකු කැඳවීමේ හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ

ඔබතුමන්ලාගේ සෑම මේසයකම බටන් එකක් තිබෙනවා. එතකොට අර වෙනදා වගේ අඩගහන්න අවශ්‍ය නෑ අර සේවකයින්ගේ සහයෝගය ලබාගන්න අවශ්‍ය වෙලාවට. ඒ බටන් එක ඔබපුවාම එතුමන්ලාට ඒක පෙන්නුම් කරනවා. ඒ අනුව එතුමන්ලා එනවා. ඒක පාර්ලිමේන්තුවේ අනුව සකස් කරලා අවසන් කරල තියනවා කියන එක තමයි සභාවට දැනුවත් කරන්නේ.

තුන්වෙනි කාරණාව සභා රැස්වීමේ කටයුතු ගරු අමාත්‍යවරුන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ලාගේ කාර්යාලවල සිට නැරඹීමට පහසුකම් සළසා තිබෙනවා. ඒ කියන්නේ මේ පද්ධතිය ගරු අමාත්‍යතුමන්ලාට සහ ලේකම්තුමන්ලාගේ කාර්යාලවලට ඒ පද්ධතිය සම්බන්ධ කරලා තිබෙනවා. ඒ අයටත් ඒ ස්ථානවලම ඉඳගෙන මේ අවස්ථාවේ සභාව තුළ කෙරෙන කාර්යය බලා ගැනීමට පහසුකම් සළසා තිබෙනවා කියන එක මේ අවස්ථාවේ දැනුවත් කරනවා. ඒ වගේම සභා රැස්වීමේ කථික ලැයිස්තුව රූපවාහිනී තිරයේ දර්ශණය කිරීමට අවශ්‍ය කටයුතු අපි සැළසුම් කරලා තියනවා. පහුගිය කාලයේ කියපු කාරණා ඒ කාරණා මේ වෙනකොට ඉවර කරලා තිබෙනවා. ඒ කථික ලැයිස්තු ටික ලැබුණාට පස්සේ අපි ඒ ටික පුවරුවේ සටහන් කිරීමට කටයුතු කරලා තියනවා. තමුන්නාන්සේලා සියළුදෙනාම දැනුවත් කිරීම සඳහා දැනුවත් කරනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා.
ගරු මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා.
ගරු මන්ත්‍රී ඉම්ටියාස් කාදර් මැතිතුමා.
ගරු මන්ත්‍රී පරාක්‍රම අතාවුද මැතිතුමා.
ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ ද අල්විස් මැතිතුමා.
ගරු මන්ත්‍රීනී වත්සලා පද්මසිරි මැතිතුමිය.
ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක මැතිතුමා.
ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර මැතිතුමා.
ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ඒ නම් කියන ලද සියළුම මැති ඇමතිතුමන්ලා වෙනුවෙන් මෙම ගරු සභාවේ නිවාඩු අනුමත කරන බව සභාවට දැනුම් දෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම : නැත**

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

මේ යටතේ ගරු මන්ත්‍රී වරුණ ලියනගේ මැතිතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே Hon.Member Waruna Liyanage*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේ පෞද්ගලික ප්‍රකාශ යටතේ ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ පහුගිය සතියේ ඇති වෙච්ච පොඩි ගැටළුවක්. මොකද පහුගිය 26 වෙනිදා ඇති වෙච්ච ගංවතුර නිසා පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාශයේ විශාල දේපළ හා ජීවිත හානි ඒ වගේම අවතැන්වීම් විශාල සංඛ්‍යාවක් සිද්ධ වුනා. ඒ වගේම ඒවාට අපි සෘජුවම හා වක්‍ර ආකාරයෙන් සහභාගී වෙලා ඒ සියළුම සහයෝගය ලබාදුන්නා. නමුත් මේ හදිසි සම්බන්ධීකරණ රැස්වීම් පවත්වනවා අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන්. ඉතින් අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා සහභාගී වෙලා ඒ ප්‍රෝග්‍රස් මීටින් එක පැවැත්වුවා. නමුත් මට ආරාධනා කළේ නෑ ඒ සම්බන්ධීකරණ රැස්වීමට. ඉතින් ඒ නිසා විශාල අපහසුතාවයකට පත්වුනා මම. මොකද ගංවතුරට හානි වෙච්ච පිරිස එක්ක හිටපු කෙනෙක් හැටියට, ඒ ජනතාවගේ දුක්ගැනවිල්ල දැක්ක කෙනෙක් විදිහට ඒ අවස්ථාවන්වල දී ඒ තීන්දු තීරණ ගන්නකොට අපට ඒවා ඉදිරිපත් කරන්න බැරි වුනාට පස්සේ විශාල අපහසුතාවකට පත් වෙනවා. ඒ නිසා මම හිතන්නේ අපේ ආසනයේ සංවිධායකවරයා හැටියට අතුල ඇමතිතුමාටත් දූරකථනයෙන් කියලා තිබුනේ. මට එහෙමවත් නෑ. මම ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් විමසුවාට පස්සේ එතුමා කිව්වා මට ආරාධනා කරන්න යෝජනාවක් තිබුනේ නෑ කියලා. අපි කණගාටු වෙනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

යෝජනාවක් තිබුණත් නැතත් දැනුවත් කරන්න ඕන.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே Hon.Member Waruna Liyanage*
----------------------------------------------------

ඒක තමයි, කියන්නේ. ඇත්තටම ගරු සභාපතිතුමා, ප්‍රාදේශීය සභාව විසුරවලා තියෙන්නේ. එතකොට මන්ත්‍රීවරු ගමේ නෑ. එතකොට සභාපතිවරයෙක් නෑ. එතකොට ඊළඟට ඉන්නේ පළාත් සභා මන්ත්‍රීතුමා. ඉතින් අපේ පළාත් සභාවේ සියළුම දෙනා ඒ සහයෝගය හැම තිස්සේම ලබාදුන්නා. ඉතින් අපෙන් මොනවා හරි යම්කිසි කරුණක් විමසලා ඒ අවශ්‍යතාවය ඉෂ්ඨ කරගන්න එක තමයි අපේ ප්‍රෝග්‍රස් මීටින් එකෙන් බලාපොරොත්තු වෙන්නේ. එහෙම නැතුව කරුණු වසං කරන්න නෙමෙයිනේ. අපි ඒවාට සහභාගී වෙන්නේ මිනිස්සුන්ගේ ප්‍රශ්න කියන්න. ඉතින් ඒ නිසා අපි එතනට සහභාගී වුනා

නම් අපටත් නිවැරදි කරුණු ලබාදෙන්න තිබුණා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මේකට මැදිහත් වෙලා, මොකද අපේ සමාජ සේවා ඇමතිතුමාටත් රත්නපුර දිස්ත්‍රික්කයේ නෑ. ඉතින් එහෙම නම් අපට කොහොමද කියන්නකෝ. ඒ නිසා අපට ඒක විශාල ප්‍රශ්නයක්. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලේකම්වරුන්ට, වරියන්ට ඔබතුමා අදම ලිපියක් යොමු කරන්න. මීට පස්සේ තියන එකකට හරි සහභාගී වෙලා කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් ඔබතුමා හදලා දෙන්න.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

එහෙම කරලා තියනවා නම් මේක විශාල වරදක්. මොකද පළාත් සභා මන්ත්‍රීවරුන්ට, දිස්ත්‍රික්කයේම ඉන්න දේශපාලන අධිකාරියේ අයට අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණයට, දිස්ත්‍රික් සම්බන්ධීකරණයට කැඳවිය යුතුයි. ඒ අයගෙන් වෙන සේවය අති විශාලයි. එකක් දෙකක් සේවා වෙන ඒවා අති විශාලයි ගරු සභාපතිතුමනි. මොකද මේක පූර්වාදර්ශයක් ගනියි නැත්නම්. පහුගිය කාල සීමාවෙම හැම කෙනෙකුටම කැඳෙව්වා. පළාත් සභාවේ, ප්‍රාදේශීය සභාවේ විපක්ෂනායක කැඳෙව්වා. ඉතින් මේ වගේ සියළුමදෙනා කැඳවන එක වැදගත් වෙනවා ගරු සභාපතිතුමනි. කැඳවන්න කියලා අපි යෝජනා කරනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*

-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ මේ කාරණාව සම්බන්ධයෙන් මමත් දැන ගත්තේ ඊට ඉස්සරින්දා හවස. දූරකථන පණිවිඩයක් ලැබුණා ගරු අමාත්‍යතුමා අපේ ආසනයේ සම්බන්ධීකරණ රැස්වීම පවත්වනවා කියලා. ඒ අනුව මම සහභාගී වුනා. විශේෂයෙන් වරුණ ලියනගේ මන්ත්‍රීතුමා කිව්වා වගේ අපේ පළාත් සභාවේ ඉන්න ආසනයේ මන්ත්‍රීවරයා. එතුමාට ඒක ලැබිලා නෑ. කොහොම වුනත් ප්‍රශ්නයක් තිබුණා එතන, ප්‍රාදේශීය ලේකම්වරයෙක් නිත්‍ය වැඩ ආවරණ නැති නිසා. මම හිතනවා මේ මොහොතේ ඒ කාරණාව ඉෂ්ඨවෙලා තියනවා. ඒ අනුව ඉදිරියේ දී, මොකද මමත් ඒකේ සම සභාපතිවරයා. ඒ නිසා එවැනි කටයුත්තක් සිද්ධ නොවෙන්න අදාළ අද ඉඳලා අපට ඒ වගකීම තියනවා ප්‍රාදේශීය ලේකම්තුමාට දන්වන්න කටයුතු කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

ස්තුතියි ! ගරු ඇමතිතුමනි. සත්‍ය වශයෙන්ම ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධයෙන් ඉතාම කෙටියෙන් ඔබතුමන්ලාට කරුණු සාකච්ඡා කිරීමේ දී විශේෂයෙන් දැන් පහුගිය කාල සීමාව තුළ මේ ඇති වෙච්ච හදිසි ආපදා තත්ත්වය නිසා අපේ රාජ්‍ය නිළධාරීතුමන්ලා, තුමියන්ලා

විශාල කාර්යය බහුලත්වයක්, ඒ වගේම විශාල අපහසුතාවයන්වලට ලක්වීමක් අපි දැක්කා. ඒ අයත් ඒ අයට කරන්න පුළුවන් උපරිම වැඩ කොටස් කරන බව අපි දැක්කා. ඉතින් ඒ අතරතුර එතුමා කිව්වා වගේ විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමන්ලා, මැති ඇමතිතුමන්ලා, පළාත් සභා මැති ඇමතිතුමන්ලා සුවිශාල කාර්යය භාරයක් මේ වැඩ කොටසේ දී ඉෂ්ඨ කළා. ඉතින් එතුමා කිව්වා වගේ ඇහැළියගොඩ ආසනයෙත් ප්‍රගති සමාලෝචන රැස්වීමකට එස්.බී.නාවින්න ගරු ඇමතිතුමා සහභාගී වුනා පහුගිය දිනක. ඉතින් මට හවස 5.00 ට විතර ඊට ඉස්සෙල්ලා දවසේ දැන ගන්න ලැබුණා එතුමා ඒ රැස්වීමට සහභාගී වෙනවා කියලා. ඊට පස්සේ මටත් පණිවිඩය ආවා රෑ 9.00 ට විතර තමයි මට පණිවිඩය ලැබුනේ ඒ අවස්ථාවට එන්න කියලා. හැබැයි ප්‍රාදේශීය ලේකම්තුමියන්ලා තුන්දෙනාම ඇහැළියගොඩ, කිරිඇල්ල සහ කුරුවිට කියන කොට්ඨාස තුනේම වැඩිපුර මම ඒ කටයුතුත් එක්ක සම්බන්ධ වෙච්ච නිසා ඉතාම කාර්යක්ෂමව ඒ රාජකාරිය ඉෂ්ඨ කළා. ඒ හැම කටයුත්තක්ම සිද්ධ වුනා. ඉතින් මටත් හවස 5.00 ට විතර පණිවිඩිය දැන ගන්න ලැබුණා එනවා කියලා. හැබැයි මට දුරකථන පණිවිඩයක් ආවා රෑ 9.00 ට විතර උදේ 8.30 ට එතුමා සහභාගී වෙනවා. එන්න කියලා. ඉතින් ඒ වගේ තත්ත්වයකුත් සිද්ධ වුනා. ඒ වගේම තවදුරටත් මතක් කරනවා නම් අතිගරු ජනාධිපතිතුමා සහභාගී වුනා රත්නපුර දිස්ත්‍රික්කයේ මේ ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න රැස්වීමකට. ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමනි, ඉතින් මට මේ වනතුරු තවම ඒ පිළිබඳව කිසිම ආරාධනාවක්වත්, දුරකථන පණිවිඩයක්වත්, ටෙලිග්‍රෑම් එකක්වත් මේ වනතුරු මට ලැබුනෙත් නෑ. ඉතින් මම අර ඇහැළියගොඩ නායගිය ස්ථානයට උදේ පාන්දර කඩාගෙන යනකොට තමයි මම දන්නේ අතිගරු ජනාධිපතිතුමා ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න රත්නපුර දිස්ත්‍රික්කයට පැමිණෙනවා කියලා. ඉතින් මට දැන ගන්න ලැබුනේ නෑ ඇහැළියගොඩට ගිහාම සමහර අය මගෙන් ඇහුවා ඇයි අර සාකච්ඡාවට ගිහිල්ලා අපේ ප්‍රශ්න ගැන කථා කරන්න මැදිහත් වුනේ නැත්තේ කියලා. ඉතින් ඒ වෙනකොට මම දැනුවත් වෙලා හිටියෙත් නෑ. ඉතින් ඒ නිසා ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ ඒ පිළිබඳව කඩිනමින් ගරු ලේකම්තුමන්ලාට, තුමියන්ලාට අපි දැනුම් දීමකුත් කරන්නම් ඒ පිළිබඳව දන්වා යැවීමට කටයුතු කරන්නම්. ඔබතුමා යම් අපහසුතාවයකට පත් වුනා නම් ඒ පිළිබඳව අපේ කණගාටුව මේ අවස්ථාවේ දී අපි ප්‍රකාශ කරනවා.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර..*

*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*

----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට ඔබතුමාගෙන් අවසර පතනවා. අතිගරු ජනාධිපතිතුමා රත්නපුරේ හදිසි ගංවතුර ආපදා තත්ත්වය සම්බන්ධයෙන් පැමිණිච්ච අවස්ථාවේ අපි පළාත් සභාව නියෝජනය කරන අපි කීප දෙනෙක් එතනට සහභාගී වුනා. එහිදී දිස්ත්‍රික් ලේකම්තුමිය පැහැදිලිවම සබරගමුව පළාත් සභාව අමතක කරලා කථා කළේ. එතන සිරිපාල කිරිඇල්ල මැතිතුමා සාක්ෂි දරනවා. සබරගමුව පළාත් සභාවක් නැති විදිහට තමයි කථා කළේ. ඊට පස්සේ ඒක මතක් කරලා දුන්නා ගරු ප්‍රධාන ඇමතිතුමා එතන ඉදලා. ඊට පස්සේ අපට ඇත්තටම යම්තාක් හරි සහයෝගය දුන්නා ඒ.ඒ.විජේතුංග පළාත් සභාවේ හිටපු මන්ත්‍රීතුමා. එතුමා කිව්වා පළාත් සභාව විශාල කාර්යය භාරයක් කළා කියන එක විජේතුංග මන්ත්‍රීතුමා කිව්වා. එහෙම අමතක වෙලා

ඉන් අනතුරුව වරුණ ලියනගේ මන්ත්‍රීතුමාට පැල්මඩුල්ලේ සිද්ධ වෙච්ච දේම රත්නපුර ආසනය තුළ විශේෂ අමාත්‍යවරයෙක් පත් කරලා ඉන්නවා. එතුමාගේ සාකච්ඡාවක් තිබ්බා ගංවතුර අවස්ථාවේ. අපට දැනුවත් කිරීමක් කළේ නෑ. ඉතින් පළාත් සභාව නොසළකා හරිනවා නම් පළාත් සභා සියල්ලම අහෝසි කරලා දාන්න ඕන පාර්ලිමේන්තුවෙන්. පළාත් සභාවක් තියනවා නම් පළාත් සභාවට ඒ ගරුත්වය ලබාදිය යුතුයි. බලය සහ ඒ අවශ්‍ය කරන කරුණු ලබාදිය යුතුයි. එහෙම නැතුව යම් යම් අමාත්‍යවරුන්ගේ යම් යම් මන්ත්‍රීවරුන්ගේ උවමනාවට පළාත් සභාවක් අවශ්‍ය නෑ. හැබැයි මේ පළාත් සභාව මේ ගංවතුර ආපදා තත්ත්වය තුළ, නායයෑම් ආපදා තත්ත්වය තුළ පළාත් සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු වැඩ කරපු ආකාරය, පළාත් සභාවේ නිළධාරීන් වැඩ කරපු ආකාරය අපි දන්නවා. ඒ නිසා මේවා හැල්ලුවට ලක් කරන්න දෙන්න බෑ. ඒ නිසා ඔබතුමා මේකට මැදිහත් වෙන්න. ජනාධිපතිතුමාගේ පටන්, අගමැතිතුමාගේ පටන් සියළුදෙනාටම මේක ගැන දැනුවත් කරන්න. මොකද මේක නොසළකා හැරිය යුතු කටයුත්තක් නෙමෙයි කියන එක තමයි අවධාරණය කරන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි. ඒ අනුව ඒ අවශ්‍ය කටයුතු ඉෂ්ඨ කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා. මීළඟට උදයකාන්ත ගුණතිලක ගරු නියෝජ්‍ය සභාපතිතුමා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ගරු සභාපතිතුමනි, අපි රටක් හැටියට ගත්තාමත්, ඒ වගේම පළාතක් හැටියට ගත්තාමත්, ඒ වගේම අපේ දිස්ත්‍රික්ක දෙකම ගත්තාම ඩෙංගු රෝගය දැඩි ලෙස වර්ධනය වෙලා තියනවා. ඉතින් ඒ වගේම අද රෝහල් බොහොමයක අද ඉඩකඩ මදි වෙලා මහා බරපතල ප්‍රශ්නයක් බවට පත්වෙලා තියනවා. ඒ වගේම ඒ රෝගීන් සංඛ්‍යාව වැඩි වෙනවා වගේම ඊළගට මරණ සංඛ්‍යාවත් ඒ වගේම වැඩි වෙමින් පවතිනවා. මේකට පළාත් සභාව හැටියට ඒ අදාළ නිළධාරීන් සම්බන්ධ කරගෙන, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සෞඛ්‍ය ඇමතිතුමා හැටියට ඒ අවශ්‍ය සහයෝගය ඒ වගේම ශක්තිය ලබාදීලා ගම් මට්ටමට ඒ වැඩ පිළිවෙල සාර්ථක කරන්න, එහෙම නැත්නම් මදුරුවන් පළවා හරින්න, එහෙම නැත්නම් මර්ධනය කරන්න කටයුතු කරනවා. නමුත් ඒ මොන කටයුතු කළත් මේවා ක්‍රියාත්මක කිරීමේ දී ලොකු ගැටළු රාශියකට පත්වෙලා තියනවා. මම ජීවත් වෙන තෝලංගමුව වසම අවට, මගේ ගේ අවට ගෙවල් ගණනාවකත් මේ වෙනකොට ඩෙංගු රෝගය වැඩි වෙලා තියනවා. එම්.ඕ.එච්.කාර්යාලයේ, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ගත්තාම වරකාපොල ඩෙංගු රෝගීන් අද වෙනකොට 300 කට වැඩි සංඛ්‍යාවක් ඒ කොට්ඨාසය ඇතුලේ ඉන්න බව වාර්තා කරලා තියනවා.

ඉතින් මේ තත්ත්වය වගේම මේවා ගැන ජනතාව දැනුවත් කරලා මේවා මර්ධනය කරන්න, ඒ මදුරුවන් බෝ වෙන ස්ථාන විනාශ කරන්න, ඒ වගේම නැති කරන්න කටයුතු කිරීමේ දී බරපතල ගැටළු,

ඒ රජයේ නිළධාරීන්ට අද ඇතිවෙලා තියනවා. ඉතින් අපේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කොට්ඨාසයක එකතු කළා දිරන්නේ නැති ද්‍රව්‍යය. අන්තිමට ලොරි දෙකක් එකතු වෙලා. එතකොට ලොරි දෙකේ ඒ නොදිරන ද්‍රව්‍ය අයින් කරන්න තැනක් නෑ. බැහැර කරන්න තැනක් නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, එහෙම නැත්නම් සභාවෙන් ඒවා භාරගන්න, ඒවා කොහේට හරි ගිහිල්ලා අස් කරන්න තැනක් ලබාදීලා නෑ. ඉතින් ඒ නිසා එවැනි තත්ත්වයන් ඇති වීමේ දී බරපතල ගැටළු රාශියකට පත්වෙලා තියනවා. ඒ නිළධාරීන් අපහසුතාවයට පත්වෙලා ඒවා විනාශ කරන්න, එහෙම නැත්නම් ඒවා ප්‍රසිද්ධියේ පුච්චන්න ක්‍රමයකුත් නෑ නිළධාරීන් හැටියට. ඒ තත්ත්වය නිසා ගැටළු රාශියකට පත්වෙලා තියනවා. ඉතින් මේ තත්ත්වය අපට අවශ්‍ය වෙන්නේ පළාත් සභාවක් හැටියට දැනුවත් කිරීම් කරනවා වගේම ඩෙංගු මදුරුවන් බෝවෙන ස්ථාන විනාශ කිරීම. ඒ වගේම නැති කිරීම අවශ්‍ය වෙනවා. දැනුවත් කිරීමෙන් පමණයි ඒක කරන්න වෙන්නේ. ඒ නිසා මේ ඩෙංගු තත්ත්වය බරපතල විදිහට වැඩි වෙලා තියනවා. ඒ නිසා අවධානය අපේ ප්‍රධාන ඇමතිතුමා මෙතන නොහිටියත් එතුමාගේ අවධානය, එතුමා කරන කටයුත්ත, ඒ වගේම ඒ ගම් මට්ටම, දැනුවත් කිරීම් කරලා මේ තත්ත්වය නැති කරන්න අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
***Hon.Chairman Kanchana Jayarathna***

---

ස්තුතියි ! ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මීළඟට ගරු අකිල සාලිය එල්ලාවල මැතිතුමා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
***Hon. Member Akila Ellawala***

---

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක මගේ පෞද්ගලික කාරණාවක් නෙමෙයි. නමුත් මේ නාය යෑම්වල දී අත්‍යාවශ්‍ය කාරණාවක් නිසා රාස්සගල රෝහල ගැන අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදෙන්න කියලා ඉල්ලා සිටින්නේ. ඒ නිසා තමයි මම ඔබතුමාගෙන් අවසර ඉල්ලුවේ ඊයේ උදේ ෆැක්ස් පණිවිඩයක් මඟින් මේ සඳහා අත්‍යාවශ්‍යම කාරණාවක්, බලන්ගොඩ ආසනයේ ජනතාවට සිද්ධ වෙන්න ඕන නිසා. ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රකාශ කර සිටින්නේ රාස්සගල ප්‍රාදේශීය රෝහල සම්බන්ධවයි. හදිසියේම නාය යෑමකට ලක්වුනා මේ රෝහල. එන්.බී.ආර්.ඕ. ආයතනයත්, ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු සියළුම රජයේ නිළධාරීන් තීරණය කළා මෙම රෝහල පවත්වාගෙන යන්න බෑ, කොයි වෙලාවේ හරි නාය යෑමකට ලක් වෙන්න පුළුවන් කියලා. ඉතින් මේ රෝහල පිහිටා තියෙන්නේ රාස්සගල ප්‍රදේශයේ, තේ වත්තක් ආශ්‍රිතව. නමුත් මේ සඳහා සාමාන්‍යයෙන් දිනකට රෝගීන් 150 ක්, 200 ක් අතර බාහිර රෝගීන් හැටියට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙනවා. විශේෂයෙන්ම පිට ආසනයක් හැටියට පැල්මඩුල්ල ආසනයේ ජනතාවත්, වේවැල්වත්ත ප්‍රදේශයේ ජනතාවත් මේ රෝහලට පැමිණෙනවා බාහිර රෝගී අංශයට.

ඒ වගේම බලන්ගොඩ ආසනයේ වසම් 5 කට අධික ජනතාවක් මේ රෝහලෙන් සේවාව බලාපොරොත්තු වෙනවා. කෙසේ වෙතත් අද වෙනකොට මේ රෝහල තිබෙන තත්ත්වය නිසා

රාස්සගල ප්‍රදේශයේම ආයුර්වේද මධ්‍යස්ථානයේ ඉහළ මහළට මෙම රෝහල මාරු කරලා තිබෙනවා. කෙසේ වෙතත් දැන් ඉඩ පහසුකම් අඩුයි. මොකද දන්ත සායන ඇතුළු අනෙකුත් සායන අත්‍යාවශ්‍ය ප්‍රතිකාර සඳහා ඉඩ නැති තත්ත්වයක් තියනවා. ඒ වගේම වැසිකිලි සම්බන්ධයෙන් සියළුම කාර්යය මණ්ඩලයත්, වෛද්‍යවරුත්, රෝගීනුත් සියළුදෙනාටම පාවිච්චි කරන්න වෙලා තියෙන්නේ එකම එක වැසිකිලියයි. එමනිසා තාවකාලිකව අඩුගානේ රෝහලක් ඉදිකරන කල් වැසිකිලි පද්ධතියක්වත් හදාගන්න පුළුවන් නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි රාස්සගල වතුයායෙන් ඉඩමක් ඉල්ලලා තියනවා මේ අළුත් රෝහල ඉදිකරන්න. ඒ සඳහා භූමියක් බලලා තියනවා ප්‍රාදේශීය ලේකම් ඇතුළු කණ්ඩායම. මම හිතන්නේ අපේ ආණ්ඩුකාරතුමා විශේෂ උනන්දුවක් දක්වනවා මේ කාලයේ දී විශේෂයෙන්ම වතු සමාගම්වලින් මේ නාය ගිය ප්‍රදේශවල ජනතාවට නිවාස හදලා දෙන්න, රෝහල් හදලා දෙන්න, පාසැල් හදලා දෙන්න අපේ ආණ්ඩුකාරතුමා විශේෂ අවධානයක් යොමු කරනවා, මේ ඉඩම් ලබා ගැනීමට. ඉතින් මම යෝජනා කරනවා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ 38 (ආ) වගන්තිය යටතේ ලබා ගැනීමට හැකියාවක් තිබෙනවා නම් මේ ක්‍රියාකාරකම ඉක්මන් කර ගැනීම හා කඩිනම් කර ගැනීමේ හැකියාව තියනවා. ඒ තුළින් අපට රාස්සගල නව රෝහලක්, ප්‍රාදේශීය රෝහල් ඇති කිරීමේ හැකියාව තියනවා. ඒ වගේම මේ වෙනකොට අපේ ප්‍රධාන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා එතුමාගේ මූලිකත්වයෙන් තමයි මේ ප්‍රාදේශීය රෝහල අද වෙනකොට ආයුර්වේද රෝහලේ උඩ මහලේ පවත්වාගෙන යන්නේ. ඒ වගේම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා යෝජනා කළා මැද්දේකන්ද වතුයායේ රෝහලක් තිබෙනවා. පළාත් සභාව යටතේ නෙමෙයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. වතු සමාගම යටතේ. එම රෝහලත් සංවර්ධනය කරලා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යොදා ගන්නත්, ඒ වගේම අළුතෙන් ප්‍රධාන ඇමතිතුමාගේ අධීක්ෂණය යටතේ ඉදිවෙච්ච වලේබොඩ පේරකැටිය සෞඛ්‍ය මධ්‍යස්ථානය අද ඉදිකරලා ඉවරයි. ඒකත් විවෘත කරලා එතකොට අර රාස්සගල රෝහලට තිබුන තදබදය සෞඛ්‍ය මධස්ථාන තුනකට බෙදී යන නිසා ජනතාවට උපරිම සේවයක් සඳහා ලබාදීමට හැකියාව තියනවා කියලා මම යෝජනා කරනවා. ඉතින් කෙසේ හෝ මෙම රාස්සගල කැඩී යන රෝහල වෙනුවට නව රෝහලක් ඉදිකරන්න ඉතාම ඉක්මණටම රාස්සගල වතුයායෙන් ඒ අවශ්‍ය භූමි ප්‍රමාණය ලබාගෙන ඒ රෝහල ඉදිකරලා දෙන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමනි. මීළඟට රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

ගරු සභාපතිතුමනි, මේ ගංවතුර හා නාය යෑම් සම්බන්ධයෙන් ඇති වුන

තත්ත්වය පිළිබඳ කාරණාවේ දී අපට ඒක පෞද්ගලිකවම බලපෑවා. ඒ වගේම ඒකෙදී අපට උදව් කරපු, විශේෂයෙන් අපේ නිවිතිගල ආසනයට සහයෝගය දීපු ගරු ආණ්ඩුකාරතුමාට, ප්‍රධාන අමාත්‍යතුමාට, සමාජ සේවා අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමාට, උදයකාන්ත ගුණතිලක මැතිතුමා ඇතුළු ඒ සහයෝගය දීපු සියළුදෙනාට ස්තුතිය පළ කරන්නත් මේක මම අවස්ථාවක් කරගන්නවා. ගරු සභාපතිතුමනි, ඒ වගේම තමයි ඒ කාරණාවේ දී රජයේ නිළධාරීන්ගේ දායකත්වය සහ ඔවුන්ගේ සහයෝගය සම්බන්ධයෙන් කථා කළා. එහිදී මම ඉතා කණගාටුවෙන් කියන්න ඕන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හැටියට වැඩිම ප්‍රතිශතයක් ගංවතුරට යට වෙච්ච ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරියගෙන් ඒ කාරණාව ඉෂ්ඨ වුනේම නෑ. දැන් නිවිතිගල එහෙම ගත්තාම ඉතාම විශිෂ්ඨ ආකාරයෙන් ඒ කාරණාව ඉෂ්ඨ වුනා. නමුත් ඇලපාත දී ඒ කාරණාව ඉෂ්ඨ වුනේම නෑ. ඉතාම ලිස්සලා යන ස්වභාවයකින් තමයි ඒ කාරණාව වුනේ. මම විශේෂයෙන්ම මේ පෞද්ගලික හේතු දැන්වීම අවස්ථාවේ දී මේ කාරණාව ඉදිරිපත් කරන්න අදහස් කළේ ගරු සභාපතිතුමනි, මේ සියල්ලක් සම්බන්ධව පළාත් සභා මන්ත්‍රීවරු අපට මෙතන පක්ෂ විපක්ෂ භේදයක් වැඩක් නෑ. පළාත් සභා මන්ත්‍රීවරු මැදිහත් කර ගැනීමේ කාරණාව හරියට සිද්ධ වුනේ නෑ කියන එක එදා අපේ සාකච්ඡාවේ දී මතු වුනා. ඒකෙදී අපි තීන්දු කළා ගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ඇමතිතුමා සියළුදෙනාම කිව්වා අපි පළාත් සභාවෙන් කරන කටයුතු පැහැදිලිවම පළාත් සභා මන්ත්‍රීවරු හරහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ අය හරහා සාධාරණව, සාර්ථකව මේක කරන්න කටයුතු කරන්න කියලා. එදාම හවස ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමාගේ උපදෙස් පරිදි අපේ කඳවුරුවලට අවශ්‍ය බඩු ටික ගන්න මම සමාජ සේවා අමාත්‍යාංශයේ ගබඩාව හැටියට ඒ වෙලාවේ පාවිච්චි කරපු අපේ සංචාරක නිකේතනයට ගිහාම මම ඒ කඳවුරුවලට අවශ්‍ය බඩු ලබාගන්න කථා කරපු වෙලාවේ සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්වරිය මට මේවා දෙන්නද ? එපාද ? එහෙම නැත්නම් කඳවුරුවල තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරියගෙන් විමසන්න අවශ්‍යයි. ඒ විමසීමෙන් පස්සේ තමයි මේක දෙන්න පුළුවන් කියලා මට කිව්වා. ඊට පස්සේ ඒ කාරණාව බොහොම දුරට ගියා. මම ඉතාම කණගාටුවෙන් මගේ කළකිරීම, අප්‍රසාදය පළ කරන්න කැමතියි. ඒ වගේම මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා ඉල්ලීමක් කරන්න කැමතියි. අවසානයේ රංජිත් බණ්ඩාර ඇමතිතුමා මට කිව්වා, නෑ, මම සහකාර ලේකම්වරයෙකුට කියන්නම්. ඔබතුමා ඒ ටික අරගෙන යන්න කියලා ඉතාම සංවේදීව ඒ කාරණාවට මැදිහත් වුනා. හැබැයි ඒ අමාත්‍යාංශයේ ලේකම්වරිය ඉතාම පහත් විදිහට ඒ බඩු ටික අවශ්‍ය තැන්වලට දීම, අනෙකුත් කාරණාවලට වඩා බොහොම පටු ආකාරයෙන් කටයුතු කරමින් පළාත් සභා මන්ත්‍රීවරයාගේ ගෞරවයට බරපතල ලෙස හානි වෙන ආකාරයෙන් හැසිරුනා කියන එක, ඒ පිළිබඳව කරුණාකරලා පරීක්ෂා කරලා ඒ පිළිබඳව තීරණයක් ගන්න කියන එක මේ ගරු සභාවට දන්වන්න කැමතියි.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார Hon. Minister Ranjith Bandara***

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය සම්බන්ධයෙන් මතු කරපු කාරණාව නිසා මම පැහැදිලි කරන්න ඕන. අපි ගරු සභාපතිතුමනි, අපේ ගරු ආණ්ඩුකාරතුමා, ඒ වගේම ප්‍රධාන ඇමතිතුමා, ඒ වගේම

සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට අපි කැඳවීමක් කරලා පළාත් සභාවක් හැටියට අපි කොහොමද මේකට මැදිහත් වෙන්නේ කියන එක ගැන සාකච්ඡාවක් තිබ්බා. ඔබතුමාත් ඒකට පැමිණියා. එහිදී අපි තීන්දු කළා පළාත් සභා මන්ත්‍රීවරුන්ට කොහෙන්වත් ආධාරයක් නොලැබෙනවා නම් අපි පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශයක් හැටියට අපි භාණ්ඩ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටෙව්වා පළාත් සභාව ඉදිරිපිට. ඒ අවස්ථාවේ පළාත් සභාවට අපට විශාල ආධාරයක් ලැබුනේ නෑ. පෞද්ගලික ධන පරිත්‍යාගශීලීන්ගෙන් හෝ වෙනත් ආයතනවලින් අපට විශාල පරිත්‍යාග සිද්ධ වුනේ නෑ. අපට යම් යම් අමාත්‍යාංශයේ ලේකම්වරියගෙත්, ඒ වගේම අනෙකුත් අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ, වරියන්ගේ හිතවතුන්ගෙන් ලැබිච්ච සහයට අමතරව අපට සිද්ධ වුනා මේ ව්‍යසනයට පත් වෙච්ච, ගොදුරු වෙච්ච අයට ඒ අයගේ කඳවුරුවලට අවශ්‍ය කරන භාණ්ඩ ලබාදෙන්න. එහිදී අපි පළාත් සභා අර මුදලින් මුදල් වෙන් කරගෙන අපි ඒ භාණ්ඩ ලබාගත්තා. ඒ භාණ්ඩ අතර මම ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස කියන්නම්. කිරිපැකට්, තුවා, ඇඳ ඇතිරිලි, පැම්පස්, මදුරු කොයිල්, ඉටිපන්දම්, ගිනිපෙට්ටි, කාන්තා යට ඇඳුම්, යට සායවල්, ආරක්ෂක තුවා, පැදුරු, කොට්ට, මෙට්ට, වළං මේ කියන භාණ්ඩ අපි ලබාගත්තා, මේ කඳවුරුවලට අවශ්‍ය කරන භාණ්ඩ. ඒවා අපට අමාත්‍යාංශයේ ලේකම්වරිය මිළදී ගත්ත භාණ්ඩ, අපි මේවා ගිණුම්ගත කළයුතුයි. එහෙම නැතුව ඉල්ලන ඉල්ලන වෙලාවට මන්ත්‍රීවරයාට දෙන්න හැකියාවක් නෑ, රාජ්‍ය නිළධාරීන්ට. මම කියනවා මම දේශපාලනය කරන පුද්ගලයෙක් හැටියට දෙන්න. නමුත් රාජ්‍ය නිළධාරීන් මේවා ගිණුම්වලට ඉදිරිපත් කළයුතුයි. ඒ නිසා තමයි අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අහන්නේ අහවල් කඳවුරට මේ භාණ්ඩ ලැබිලා තියනවාද ? මොකද අමාත්‍යාංශයෙන් කඳවුරුවලට භාණ්ඩ ඇරියා. පැල්මඩුල්ලටද, ඇහැළියගොඩටද, නිවිතිගලටද, ඇලපාතටද, මේ කියන අවශ්‍ය කරන හැම කඳවුරකටම අපි භාණ්ඩ ඇරියා. අපේ වාහනවල දාලා අපි භාණ්ඩ ඇරියා. ඒක විමසීමක් කරලා තමයි අමාත්‍යාංශ ලේකම්වරිය මේක දෙන්න කටයුතු කරන්නේ. එහෙම නැත්නම් ඒ භාණ්ඩ ලබාදුන්න තැනට නැවත වතාවක් ඒ භාණ්ඩ යනවා නම් ඒකේ ප්‍රයෝජනයක් නෑ. ඒක නිශ්ඵල ක්‍රියාවක්. ඒක තමයි විමසලා තියෙන්නේ. මම ලේකම්තුමියගෙන් පැහැදිලිව ඇහුවා මොකක්ද මෙතන සිද්ධ වුනේ ? මට පැහැදිලිව කිව්වේ මෙන්න මේ කාරණාව සිද්ධ වුනා ගරු ඇමතිතුමනි. මේකයි සිද්ධ වුන කාරණය. ඒ නිසා අමාත්‍යාංශ ලේකම්තුමියගේ කාර්යය භාරය හරි හැටි ඉෂ්ඨ වුනා කියන එක තමයි මම දකින්නේ. එතුමා යම්කිසි අපහසුතාවයකට පත් වුනා නම් ඒ භාණ්ඩ ලබා ගැනීමේ දී මම කණගාටුවට පත් වෙනවා. නමුත් අමාත්‍යාංශයක ලේකම්වරියක් කියන්නේ දේශපාලනය කරන කෙනෙක් නෙමෙයි. මම කියනවා දේශපාලඥයෙක් හැටියට, දෙන්න. කවුරු ඉල්ලුවත් කියන්නේ දෙන්න. ඒක තමයි අපේ කර්තව්‍යය. නමුත් අමාත්‍යාංශයක ලේකම්වරයෙක් හෝ කවුරු හෝ නිළධාරියෙක් ඒ අය ඉදිරිපත් කරන්න ඕන ගිණුම්වලට මේ ලබාදෙන භාණ්ඩ. මෙතන මා ළඟ තියනවා භාණ්ඩ ලැයිස්තුව. ඇලපාතට ලබාදුන්න ප්‍රමාණය. නිවිතිගලට ලබාදුන්න ප්‍රමාණය. ඒ වගේම රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ව්‍යසනයට ලක් වෙච්ච සෑම තැනකටම ලබාදුන්න විස්තර තියනවා. ඒ විස්තර සහ මුදල් ප්‍රමාණයත් එක්ක තියනවා. මට ඉදිරිපත් කරන්න පුළුවන්, මේක විවෘතව තිබෙනවා. ඒ නිසා මම බැහැර කරනවා අමාත්‍යාංශයේ ලේකම්වරිය එහෙම ද්වේෂ සහගතව කටයුතු කළේ නෑ. සියළුදෙනාටම සාධාරණව ඉෂ්ඨ කළා කියන එක මට පැහැදිලිව ප්‍රකාශ කරන්න පුළුවන්.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි. දැන් ගරු මැති ඇමතිතුමන්ලා, අපි මේ පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මේ සාකච්ඡාව යන්නේ. දැන් අපි ගියවර සභාවේ දී මේ ආපදා තත්ත්වය අපි මේ පිළිබඳව සාකච්ඡා කළා සම්පූර්ණයෙන්ම. දැන් තවදුරටත් සළකා බලමින් තමයි අද සභාවෙදීත් මේ දෙන්නේ. ඒ නිසා මේක දිගින් දිගට ගෙනියන්න එපා. න්‍යාය පත්‍රය මට පවත්වාගෙන යායුතුයි. මොකද දැන් නැත්නම් පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කටයුතු කළයුතු ආකාරය පිළිබඳව ඔබතුමන්ලා දැනුවත්නේ. ඒ නිසා මේක විවාදයකට යා යුතු නෑ. ඔබතුමා යම්කිසි ගැටළුවක් ඉදිරිපත් කළා. ඒකට ඇමතිතුමා පිළිතුරක් දුන්නා. දැන් මොකක්ද ඔබතුමා නැවත ප්‍රකාශ කරන්න හදන්නේ ?

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

ගරු සභාපතිතුමනි, මම රංජිත් බණ්ඩාර ඇමතිතුමාගේ කථාව සම්බන්ධයෙන් කියන්නේ. මගේ කථාවේ දී ඉස්සෙල්ලත් මම කිව්වා එතුමා ඉතාම සංවේදීව මේ කාරණාවේ දී මැදිහත් වෙලා මේ කාරණාවේ දී සාධාරණය ඉටු කරන්න කටයුතු කළා. නමුත් ඒක වුනේ නෑ කියන එක තමයි මම අදහස් කළේ. මම විශේෂයෙන්ම කියන්න ඕන මම කොමසාරිස්වරයා හරහා ලේකම්වරු හරහා රංජිත් බණ්ඩාර ඇමතිතුමාගේ උපදෙස් පරිදිම ඊට කලින් අවශ්‍ය කඳවුරුවලට බඩු ටික අපි අරගෙන ගියා. ඒ ගැන විමසීමක්, එහෙම කාරණාවක් වුනේ නෑ. හැබැයි මේ වෙලාවේ ගරු ආණ්ඩුකාරතුමයි, ප්‍රධාන ඇමතිතුමයි, අපි සියළුදෙනා මන්ත්‍රීවරු හරහා මේක යවන්න ඕන කියලා තීන්දු කරලා පැයකින් වෙච්ච දේ තමයි මේ. ගරු සභාපතිතුමනි, මේක හම්බ වෙනකල් මම බලාගෙන ඉන්න වෙලාවේ දී මගේ ලඟ තියනවා මගේ ෆෝන් එකෙන් ගත්තු වීඩියෝ එක මට පෙන්වන්න පුළුවන්. කිසිම අත්සනක් නැතුව, කිසිම දෙයක් නැතුව ත්‍රීරෝද රථයකින් ඇවිල්ලා ඒ ගබඩාවේ තිබුණ බඩු, ඒ ලේකම්තුමිය එතන ඉන්නැද්දී ත්‍රීරෝද රථයට පටවලා දෙන්නෙක් එක්ක අරගෙන ගිය එකේ වීඩියෝ දර්ශනය මගේ ලඟ තියනවා. එතකොට ඒකේ කවුරුවත් අත්සන් කළේ නෑ. කවුරුත් දැක්කේ නෑ, ඔය කියන විදිහේ විමසීම් වුනේ නෑ. මම ඒවා කියන්නේ නැතුව තමයි මේ කිව්වේ. ඒ නිසා එවැනි අකටයුතුකම් සිද්ධ වුනා මන්ත්‍රීවරයා හැල්ලුවට ලක් කරන.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த*
*Hon. Minister Athula Kumara Rahubadda*

---

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මන්ත්‍රීවරයෙක් විදිහට රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා යම් අපහසුතාවයකට පත් වුනා නම් සියළු මන්ත්‍රීවරු ඒ වගේ ආධාර උපකාර ගත්ත, අපි කණගාටු වෙනවා. නමුත් මේ වෙලාවේ අපි කියන්න ඕන රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා විශාල කාර්යය භාරයක් කළා. පාටක් බැලුවේ නෑ. පක්ෂයක් බැලුවේ නෑ. පුද්ගලයෙක් බැලුවේ නෑ. මන්ත්‍රීවරුද ? ඇමතිවරුද ? තරා තිරම බැලුවේ නෑ. තැන කොතන ද අවශ්‍ය තැනට, මම හිතන්නේ මගෙත් කඳවුරක් තිබුණා. හැබැයි නිර්දේශය විතරයි දුන්නේ.

අත්සනක්වත් දුන්නේ නෑ. කිරිපිටි ගංවතුරෙන් උණු කරලා පොවපු තැනකට කිරිපිටි පැකට් 10 ක් යැව්වා, හැබැයි කිසිම අත්සනක්වත් දෙන්න බැරි වුනා. ඒ වගේ සානුකම්පිත දේවල් සිද්ධ වුනා. ඒ වගේම නිළධාරීන් විදිහට මම හිතන්නේ පහුගිය කාලේ ඇයත් ගංවතුරට යටවෙලා හිටියේ. එහෙම කාර්යය භාරයක් අපේ පළාත් සභාවේ නිළධාරීන් කළා. අතපසුවීම් පුංචි පුංචි දේවල් සිද්ධ වෙන්න ඇති. නමුත් මම ඉතාම ගෞරවයෙන් කියනවා මේක ගෙනියන්න එපා. මොකද අපි මේ සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවෙනුත් බැට කෑවා. වෙනත් නිළධාරීන්ගෙනුත් බැට කෑවා. හැබැයි පළාත් සභාවක් විදිහට අපි එකතු වෙලා පාටක් බැලුවේ නෑ. පක්ෂයක් බැලුවේ නෑ. අපි දෙපාර්ශවයම එකතු වෙලා දෙපාර්ශවයටම කරන්න පුළුවන් උදව් උපකාර ටික කළා. ඉතින් ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා යම් අපහසුතාවයකට පත් වුනා නම් ඇමතිවරු විදිහට අපෙත් කණගාටුව අපි එතුමාට ප්‍රකාශ කරනවා. ගරු මන්ත්‍රීතුමාගෙන් අපි ඉල්ලනවා මේක දිගට ගෙනියන්න එපා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු ඇමතිතුමනි. මම හිතන්නේ රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමාට ඇති වෙච්ච ගැටළුව පිළිබඳව ගරු ඇමතිතුමා ඒ පිළිබඳව එතුමාගේ ප්‍රකාශයේ දී පැහැදිලි කරන්න යෙදුනා. තවදුරටත් ඔබතුමාට ඒ පිළිබඳව යම්කිසි හිත් තැවුලක් තියනවා නම් මම හිතන්නෙ බොහොම අත්දැකීම් තියන, බොහොම ජ්‍යෙෂ්ඨ ගරු අමාත්‍යවරයෙක් හැටියට රංජිත් බණ්ඩාර ඇමතිතුමා ඒ පිළිබඳව ඔබතුමා සමඟ සාකච්ඡා කරලා යම් හිත් තැවුලක් තියනවා නම් ඒ පිළිබඳව කටයුතු කිරීමට පියවර ගනියි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ඒක ගරු අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා කිව්වා වගේ සියළුම ගරු මැති ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා ඒ වගේම නිළධාරීතුමන්ලා, තුමියන්ලා විශාල වැඩ කොටසක මේ වෙලාවේ නිරත වුනා. යම් අතපසුවීමක් හරි වෙලා තියනවා නම් ඒ පිළිබඳව මම හිතන්නේ ගරු ඇමතිතුමා මැදිහත් වෙලා ඔබතුමා එක්ක ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරයි කියලා විශ්වාස කරනවා. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපහසුතාවයට පත් වෙන නිසා මම සභාව කල් තබන අවස්ථාවේ වෙලාව ඉල්ලලා තියෙන්නේ. අන්න ඒ අවස්ථාවේ දෙන්න මට මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්න.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

හොඳයි. මීළඟට නිලන්ත ජයකොඩි මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ நிலந்த ஜயசிங்க***
*Hon Member Nilantha Jayasighe*

---

ගරු සභාපතිතුමනි, හදිසි ගංවතුර තත්ත්වයත් එක්කම, නාය යෑම් උවදුරට ඇත්තටම දරුණු තත්ත්වයක තියනවා. දැනටත් ප්‍රදේශ හඳුනාගෙන තියනවා. ඒ වගේම මම හිතන්නේ හඳුනා ගත්තත් විශාල නාය යෑමේ තර්ජනයකට ලක් වෙච්ච ප්‍රදේශයක් තමයි දෙල්වල ප්‍රදේශය. මම හිතන්නේ තර්ජනයට ලක් වුනා කියලා කවුරුවත් බලන්න ගිහිල්ලා නෑ. බලලා තියනවා. ඒ වුනාට යම්කිසි තීන්දුවකට ඇවිල්ලා නෑ. මොකද විශාල ගම්මානයක් දෙල්වල කියන්නේ. ඒකේ කිලෝ මීටර් දෙකක් පමණ දුරට එක දිගටම ඒ කඳු වැටිය පුරාම පැළි ඉරි තියනවා දැනටත්. ඒ නිසා ඒ ප්‍රදේශය ඉතාම දරුණු තත්ත්වයක තමයි තියෙන්නේ. ඒ නිසා ඒ ජනතාව ඉවත් කිරීමේ වැඩ පිළිවෙලක් තවම ආරම්භ කරලා නෑ. මම හිතන්නේ ඇන්දාන වතු ප්‍රදේශයෙන් පහුගිය කාලේ ඉඩම් වෙන් කරලා දුන්නා. තවත් පිරිසක් පැබොටුව ප්‍රදේශයෙන් ඉවත් කළා. මම හිතන්නෙ දැනට තියන තර්ජනය අනුව ඒ ප්‍රදේශය පරීක්ෂා කරලා, මම හිතන්නේ භූ විද්‍යා එකෙන් ගිහිල්ලා හරි කමක් නෑ නැවත වතාවක් පරීක්ෂා කරලා ඒ ප්‍රදේශයේ ජනතාව ඉවත් කිරීමේ කටයුත්ත සිදුකළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මම ඒ ප්‍රදේශයට ගියා. ඉතාම කඳු සහිත ප්‍රදේශයක්. කන්ද මුදුනින් සහ කන්ද පාමුල තවත් පිපිරුම් ඉරක් තියනවා. ඒ නිසා ගමේ ජනතාව කියනවා මේක නාය යෑමේ තර්ජනයට ලක් වෙනවා කියලා. ඒ වගේම ගිහිල්ලා බැලුවාම තේරෙනවා නාය යෑමේ තර්ජනයක් තියනවා කියලා. විශාල ප්‍රදේශයක් නාය යෑමේ තර්ජනයට කල් වෙනවා. ඒ වගේම පාමුල තියෙන්නේ ගඟ. ගඟ හරස්වීමේ තර්ජනයක් තියනවා නායක් ආවොත්. ඒ නිසා ඒ ප්‍රදේශයේ ජනතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩම් අවශ්‍ය ප්‍රමාණයට කොහොම හරි හොයලා බලලා වතු ප්‍රදේශවලින් හරි කමක් නෑ ජනතාව ඉවත් කිරීමේ වැඩ පිළිවෙල කරන්න වෙන බව මතක් කරන්න ඕන. ඒ පිළිබඳව මතක් කරන්න මම කථා කළේ. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! නිලන්ත ජයකොඩි ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු ජී.එම්.කරුණාපාල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member G.M.Karunapala*

---

ගරු සභාපතිතුමනි, පසුගිය දා සිදුවුන විපත්වලින් විශේෂයෙන් ජීවිතක්ෂයට පත් වෙච්ච අයට ශෝකය ප්‍රකාශ කරනවා. ඊට අමතරව අභිංසකත්වයට පත් වෙච්ච අය පිළිබඳව සිහිගැන්වීමක් කරලා ඔවුන්ට ඉක්මන් පිළිසරණයන් දියයුතුයි කියන මතය මත මේ නාය යෑම්, ගංවතුර පහුගිය අවුරුද්දෙත් ආවා. වර්ෂ ගණනාවක් දිගටම ආවා. අපි ඒ අවස්ථාවල දී දිය හැකි සියළුම සහයෝගය මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව, පළාත් පාලන ආයතන හා පෞද්ගලික අංශ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සියළුදෙනා ඒකරාශී වෙලා ඒ කටයුත්ත කෙරෙනවා. මෙවරත් ඒක අගේටම කෙරුනා. නමුත් ස්ථිරසාර විසඳුම්

මාර්ගයකට යා යුතුයි කියන මතයේ තමයි මම ඉන්නේ. දැනට සමහර ප්‍රදේශවලට ඇති වෙන්න මාසයකට හමාරකට කෑම් බීම් තියනවා. සමහර ගම්මානවලට අර නිලන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ නොලැබුණ ගම්මානත් තියනවා. මේක පොඩි පොඩි ක්‍රියාදාමයන්වල වෙනස් කමක් නිසා සිදුවුන දෙයක් සේ සළකන අතර, අපි දැඩි ලෙස ඉල්ලීමක් කරන්නේ මධ්‍යම ආණ්ඩුවෙනුත්, පළාත් සභා හා අනෙකුත් ආයතනවලිනුත් මේ මිනිස්සුන්ට බියක් සැකක් නැතුව ජීවත් වීමේ ක්‍රමවේදයක් හදන්න කියලා. දැන් අපි ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් ඉල්ලීමක් කරලා තියනවා තවම කඳවුරුවල. තවම ගෙවල් දොරවල් අත ඇරලා ඥාති ගෙවල්වල සිටින අයගේ බිය සැක නැති කරවීමේ ඉක්මන් ක්‍රියා මාර්ගයකට එන්න කියලා. නාය යනවාද ? නැද්ද ? ගංවතුරෙන් විනාශ වෙනවාද ? නැද්ද ? මෙන්න මේ සිද්ධාන්තය තවමත් කෙරිලා නෑ කියන කරුණ ඉතා පැහැදිලිව ඉදිරිපත් කරනවා. නිළධාරීන්ගේ අඩු ලුහුඬුකමක් තියෙන්න පුළුවන්. නමුත් මේ ජනයාට බියක් සැකක් නැතුව ජීවත් වෙන්නට ඉන්න තැනක පැල් කොටයක් ගහගෙන හරි සරිලන ක්‍රමයක් අපි සූදානම් කරලා දියයුතුයි.

ඊළඟට අපි හැමදාම කියන කථාව මේ නාය යෑම්වලට ලක්වෙච්ච අයට නිතරම ගංවතුරින් හා පිටාර ගැලීමෙන් විපතට පත් වෙච්ච අයට ඉඩම් ලබාදීමේ කටයුත්තට අපි තවම අපොහොසත් වෙලා. ගිය අවුරුද්දට ඉස්සෙල්ලා අවුරුද්දේ සිදුවුන සිද්ධාන්තවල දීත් තවම ඒ අයට ඉඩම් කැබැල්ලක් ලැබිලා නෑ. ඒ නිසා අපි කිසි භේදයකින් බින්නයකින් තොරව මධ්‍යම ආණ්ඩුවත් එක්කත්, අනෙකුත් ආයතනත් එක්කත් සාකච්ඡා කරලා මෙන්න මේ අයට අඩුම වශයෙන් පර්චස් 15 ක් වත් හැකි ඉක්මණින් ලබාදීමේ ක්‍රමයක් අපි හැදුවොත් අපි කළ සද්කාරවල වැදගත්ම සද්කාරය එය වෙනවා කියලයි මම දකින්නේ. ඊට පස්සේ ඒ අයගේ නිවසක් හදා ගැනීමේ ක්‍රමවේදයකට අපි යා යුතුයි. එහෙම නම් අපි සාමූහිකව මේ කරන්නා වූ ක්‍රියාදාමය මත එය සාර්ථක වුවහොත් රජයටත්, අනෙකුත් ආයතනවලටත් ඉඩම් ලබාදීමෙන් වැළකී සිටිය නොහැකියි. ඒ නිසා අපි බලාපොරොත්තුවක් තියනවා ඒකාබද්ධව, දේශපාලනයකින් තොරව අත්වැල් බැදගනිමින් මෙන්න මේ අයගේ මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් ලබාදීමේ කටයුත්තට මැදිහත් වෙන්නටත්, ඊට අමතරව නිවාස සාදා ගැනීමේ ක්‍රමයට ඇතුළත් වෙන්නටත් අත්වැල් බැදගෙන බලාපොරොත්තුවක් තියනවා. ඒ එක්කම අපි සඳහන් කළයුතුයි අදත් රත්නපුර දිස්ත්‍රික්කයේ පාසැල් ගණනය කරලා බැලුවොත් එහෙම පොත්පත් හා පාසැල් ද්‍රව්‍ය නොමැති දහස් ගාණක දරු දැරියන් සිටිනවා. මේ අය කෙරෙහි බලන පැතිකඩය ටිකක් අඩුයි. අර දෙරණ වගේ ආයතනවලින් ලබා දුන්න සද්කාරය නොතිබුනා නම්, ලැබුනේ නෑ කියන කාරණය නෙමෙයි මම මේ කියන්නේ. නොලැබුණා නම් අපට ඒ තරම් සතුටු විය නොහැකියි. ඒක හින්දා අපි මේ ආහාර පාන හා අනෙකුත් ද්‍රව්‍ය ලබාදෙනවා සමඟම අන්න ඒ පාසැල් ළමුන්ගේ අවහිරතාවය ඉටුකර ලීමට අපි කටයුතු කිරීමට ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුයි. ඒ නිසා මම කාලය ගන්නේ නෑ. මම මේ කියන්නේ කාටවත් චෝදනාවක් නෙමෙයි. අපි ඔක්කෝම අත්වැල් බැදගෙන මෙන්න මේ සැබෑ ඉල්ලීම් ටික මත කටයුතු කළොත් ඉක්මන් සහනයක් සැළසේවි. එය තමයි ලබන පොසොන් පොහොයට ගංවතුරින් හා නාය යෑමෙන් සිදුවෙන විපත් අවම කළහැකියි කියන මතය මා ඉදිරිපත් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! කරුණාපාල ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.

***ගරු සභානායක අසෝක ජයවර්ධන.***
***கௌரவ ஆ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ මා කථා කරන දේ මීට පෙර මේ සභාවේ සාකච්ඡා වුනත් මම සඳහන් කළයුතු කාරණාවක් තියනවා. අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් පිළිබඳව. අපේ ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා 16 වෙනි දින සභාවේ දී යෝජනාවක් ගෙනාවා ගරු සභාපතිතුමනි, නාය යෑම්, සුළි සුළං, ගංවතුර ආදී හදිසි ආපදාවන්හිදී එම ආපදාවන්ට ලක්වූවන්ට කඩිනමින් සහන සැළසීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් සැකසීම යෝග්‍ය බව මෙම ගරු සභාව වෙත යෝජනා කරනවා කියලා එතුමා ඊට පෙර සිදුවෙච්ච කාරණා පිළිබඳව කල්පනා කරලා තමයි යෝජනාව ඉදිරිපත් කරන්න ඇත්තේ. නමුත් ඒ ඉදිරිපත් කළා විතරයි, දවස් 10 යි ගත වුනේ. විශාල ආපදාවකට අපි මුහුණ දුන්නා, ගංවතුර ආපදාව. ඉතින් මේ වගේ අවස්ථාවල දී ආධාර ලබාදීමේ ක්‍රමවේද දෙකක් තියනවා. එකක් පුද්ගලිකව මිනිස්සු ලබාදෙන ආධාර. අනෙක රජයේ මුදල් වියදම් කරලා කරන සහන සළසා දීම. ඇත්ත වශයෙන්ම රාජ්‍ය නිළධාරියෙකුට මේක ඉතාම වගකීමෙන් කරන්න ඕන. ඒ නිසා මම මේ රජයේ මුදල් වැය කරලා කරන සහන බෙදා දීම පළාත් සභාවෙන් කළත්, මධ්‍යම රජයෙන් කළත් ඒක ඉතාම ක්‍රමවේදයක් ඇතුව, නීතිරීතිවලට එකඟතාවයෙන් කරන්න ඕන කියන එක කවුරුත් පිළිගන්න ඕන. ඒ නිසා අපේ ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමා ඒ පිළිබඳව රජයේ කටයුතු ආරක්ෂා කරමින් කථා කිරීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා.

නමුත් අපට වෙනත් ආධාර බෙදා දීමේ දී ඒ වගේ බලපෑම් ඒ වගේ කිසිවක් නෑ. ඒ නිසා ඒවා නිදහසේ බෙදා දීමේ කටයුතුවල යෙදුනාට එච්චර වරදක් ඇති කියලා මම හිතන්නේ නෑ. නමුත් ඒකත් ක්‍රමවේදයක් ඇතුව කෙරෙන්න ඕන. නමුත් මම සඳහන් කරන්නේ ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව පිහිටුවන්නත් ඉස්සෙල්ලා කාලයකට පෙර අපි දන්න කාලයේ ඉඳලා, අපි කුඩා කාලේ ඉඳලාම මේ ගංවතුර එනවා. ගංවතුර ඇවිල්ලා ඒවාට සහන සළසනවා. මේ හැම එකකදීම ප්‍රධාන තැන ගත්තේ රාජ්‍ය නිළධාරියා. රාජ්‍ය නිළධාරියා ඒ කාලේ දැන් අහවල් ගේ යට වෙලා කියනකොට යට වෙලා තියන නිවාස ගාණ මෙච්චරයි, ආපදාවට පත්වෙලා තියන පිරිස මෙච්චරයි, සහන සැළසිය යුතු පිරිස මෙච්චරයි කියලා දන්නවා. ඒ නිසා රාජ්‍ය නිළධාරියා දැනුවත් වෙලා හිටපු කාලයක් ඒ කාලය තුළ ඉතාම හොඳින් ඒවාට ආධාර සැපයීම ආදිය ඉෂ්ඨ වුනා. අදත් අපි බලාපොරොත්තු වෙන්නේ රාජ්‍ය නිළධාරියෙකුගෙන් ඒ කටයුතු. ඒ නිසා මේක රාජ්‍ය නිළධාරීන්ම තමයි මේ කටයුත්ත නිසි පරිදි පාලනය කරන්න ඕන කියන එක තමයි මගෙත් මතය. අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමා කිව්වා වගේ ඒ අය මේවා සිදුකරනවා නම් මොකවත් කතන්දර අහන්නේ නැති වෙන්න ඉටු කරන්න පුළුවන් කියන එක මම සඳහන් කරමින් අද පත්වෙලා තියන විපත්වලින්, අද පත් වෙච්ච විපත් වගේම මීට පෙර කාලවල සිදුවෙච්ච විපතුත් සිදුවෙලා තියෙන්නේ මහජනතාව ඒවා පිළිබඳව

දැනුවත් නොවුන නිසා කියන එක මම මීට ඉස්සරත් සඳහන් කළා. ඒ නිසා නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි යම් ක්‍රමවේදයක් කියන එකේ මුල් තැන ජනතාව දැනුවත් කිරීම. ජනතාව ආපදා පිළිබඳව දැනුවත් කිරීම. ඒවාට සූදානම් වීම. ඒවාට ලබාදෙන උපදෙස් පිළිපැදීම කියන එක නැවතත් ඒ ක්‍රමවේදයට කටයුතු කිරීම සුදුසුයි කියන එක ඔබතුමාට යෝජනා කරමින් ඔබතුමාට ස්තුති කරමින් නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමනි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ ගංවතුර, නායයෑම්, ඒ වගේම උන්හිටිතැන් නැතිවීම් ගත්තාම අපේ කරුණාපාල ගරු මන්ත්‍රීතුමා කිව්වේ ලබන පොසොන් එකට පෙර මෙය ඉටුවිය යුතුයි කියලා. ගරු සභාපතිතුමනි, මේක පොසොන් එකට පෙර නෙමෙයි මම සිහිපත් කරනවා එතුමාට 94 ඉඳලා 2015 වෙනකලුත් මේ ප්‍රශ්නය තිබුණා ගරු සභාපතිතුමනි. ඒ අතරින් ගත්තාම මම ඉන්නවා. අපි එකඟයි. රිසිවේෂන් එකේ, අනවසර, උන්හිටිතැන් නැති තැන්වල පදිංචි ජනතාව විශේෂ කරගෙන මේ ඉඩම් ලබාදීම. මේක මේ අවුරුද්දකින් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. පූර්ණ කාලීන වැඩ පිළිවෙලක් කරන්න ඕන ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, අපටත් අදහස් දක්වන්න අවස්ථාව දෙන්න. අපි කියන්නේ ඒ අනුව ගත්තාම මේක අවුරුදු 15 කටවත් ටාගට් කරගන්න ඕන. අපි හැමදාම කියන දෙයක්නේ. මම ගරු සභාපතිතුමනි, අවුරුදු 19 ක් නොකඩවාම ලොරියේ පාන් පුරවා ගන්නවා. අල උයනවා. පරිප්පු උයනවා. සීනි සම්බෝල හදනවා. අපි මේක බෙදනවා. නමුත් මේ අවුරුද්දේ, ගිය අවුරුද්දේ අපට දෙන්න බැරි වුනා. අපේ වත් පොහොසත්කම් අඩු නිසා ගරු සභාපතිතුමනි. මෙතන මම ඉන්නවා නිතරම. මේ නාය යෑම් හා ගංවතුරට යන වෙන තැන් විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේක රක්ෂිතයක් වියයුතුයි. මේක හිඟන්නාගේ තුවාලයක්. අවුරුද්දකට වතාවක් එන තුවාලයක් මේක. මේ තුවාලේ ඔඩු දුවන්න නොදී අපි කියන්න ඕන අපි මේ අද විවාදය ගත්තාම පක්ෂ විපක්ෂ සියළුමදෙනාගේ අතිගරු ජනාධිපතිතුමාට, අගමැතිතුමාට මේ ගැන දැනුවත් කරන්න. මොකද මේ ගංවතුරට යට වෙන එක තුවාලයක් කරගන්නේ නැතුව අපි අර අවුරුද්දෙන් පොසොන් එකට දෙන්න විශ්ම කර්ම දිව්‍ය පුත්‍රයෝ නෑ. අපි කියන්නේ මේක පූර්ණකාලීනව. අවුරුදු 15 කට ටාගට් කරගත්තා නම් ගරු සභාපතිතුමනි, මේක නැත්නම් අපි හැමදාම කියන එකක්නේ. පරාක්‍රම යුගයේ කෝටි 5 ක් හිටියා, අද දෙකෝටි දස ලක්ෂයයි. ඇළට, දොළට, ගඟට, මුහුදට බාදනය වෙලා ගිය ප්‍රමාණය ගත්තාම ඉතා සීමිත ඉඩම් ප්‍රමාණයක්. එහෙම නම් මේ රටේ ජීවත් වෙන දෙකෝටි දස ලක්ෂයක්, මේකෙන් ¼ ක් ඇති නාය යෑම්වලට, ගංවතුරට යට වෙන උදවිය. මේ උදවියට ස්ථිරසාර ගෙවල්, ඉඩම් ලබාදීමේ කටයුත්ත කරන්න කියන අතර, මේවා සදාකාලික රක්ෂිත වියයුතුයි. මේවායේ ජනතාවට පය ගහන්න නොදිය යුතුයි. මේවා ප්‍රාදේශීය ලේකම් භාරයේ වියයුතුයි ගරු සභාපතිතුමනි. මේ යෝජනාව අතිගරු

ජනාධිපතිතුමාට, අගමැතිතුමාට මේ සභාවෙන් අදම අරින්න කියලා මම යෝජනා කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සිරිපාල කිරිඇල්ල විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. මම මේ ගරු සභාවේ ගරු මැති ඇමතිතුමන්ලා සියළුදෙනාටම නැවත වරක් පෙන්වා දෙනවා රීති පටිපාටියේ පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ රීති පටිපාටි පොත නැවත බලන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. කරුණාකරලා රීති පටිපාටි පොතේ 36 වෙනි වගන්තියේ අංක 1 සිට 8 දක්වා පෞද්ගලික ප්‍රකාශ කිරීම් සඳහා කටයුතු කළයුතු ආකාරය පිළිබඳව පැහැදිලි කරලා තියනවා. හැබැයි බොහොම සානුකම්පිතව සළකා බලා පසුගිය සභා වාරයේ දී අපි මේ රත්නපුර දිස්ත්‍රික්කයට සහ ප්‍රදේශ ගණනාවකට ඇති වෙච්ච ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න බොහොම ගෞරවනීය විදිහට මේ ගරු සභාවට අපි ඉඩකඩ ලබාදුන්නා. එතකොට දැන් ඊළඟට අද දවසේ දී යම් යම් ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉල්ලීම් කළා අද දවසේ දී පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ යම් යම් පෞද්ගලික ප්‍රකාශ කිරීම් කරන්න අවශ්‍යයි, ඒකට ඉඩකඩ ලබාදෙන්න කියලා ඉල්ලීම් කරපු නිසා අපි ඒකට ඉඩකඩ ලබාදුන්නා. ඉතින් ඒක නිසා සදාචාර සම්පන්නව මින් ඉදිරියට පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කටයුතු කිරීමේ දී කටයුතු කරන්න කියලා බොහොම කරුණාවෙන්, බොහොම ගෞරවයෙන් ගරු සභාවේ සියළුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කථා කළයුතු කරුණු මොනවාද කියන එක පිළිබඳව රීති සංග්‍රහයේ 36 වගන්තියේ අංක 1 සිට 8 දක්වා පැහැදිලි කරලා තියනවා. ඒ නිසා විවාද පවත්වන්නට, උත්තර දෙන්න, පිළිතුරු දෙන්න මේ පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ සූදානම් වෙන්න එපා කියන එක ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ න්‍යාය පත්‍රය මම පවත්වාගෙන යා යුතුයි. සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට මේ පිළිබඳව සාකච්ඡා කරන්න න්‍යාය පත්‍රය තුළ ඉඩකඩ තියනවා. අවස්ථාව තියනවා. තමුන්ට අවශ්‍යයි නම් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනල්ලා ඒ පිළිබඳව සභා කටයුතු කාරක සභාවේ දී සාකච්ඡා කරලා ඉදිරිපත් කරන්න පුළුවන්. දැන් මේක මේ දිගින් දිගටම මේ ආකාරයට යන්න ගත්තොත් මේ සභාවේ ගරුත්වයට මේක බොහොම හෑල්ලුවට ලක්වෙන කාරණාවක් බවට පත් වෙනවා. ඒ නිසා බොහොම ගෞරවයෙන් මේ සභාවෙන් ඉල්ලා සිටිනවා මින් ඉදිරියට ඉදිරි සභාවාර තුළ දී පෞද්ගලික ප්‍රකාශ කිරීම් රීති පටිපාටියට අනුව ඉදිරිපත් කරන ඒවාට පමණක් ඉඩ දෙනවා. එතනින් එහා කිසිවකට ඉඩ ලබාදෙන්නේ නෑ. ඒ අනුව කටයුතු කරන්න කියලා ඉතාම ගෞරවයෙන් මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපි දන්නවා පහුගිය කාල සීමාව තුළ ඉතාම ශෝචනීය තත්ත්වයකට අපට පත්වෙන්න සිද්ධ වුනා. බොහෝ දෙනෙකුගේ ජීවිත නැති වුනා. ඉතින් ඒ වෙලාවේ දී තමුන්නාන්සේලා සියළුදෙනාම ගරු ආණ්ඩුකාරතුමා, ඒ වගේම ප්‍රධාන ඇමතිතුමා, ඒ වගේම අපේ සමාජ සේවා ඇමතිතුමා ප්‍රමුඛ අමාත්‍යතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා, ඒ වගේම ප්‍රධාන ලේකම්තුමා ප්‍රමුඛ මේ අමාත්‍යාංශ ලේකම්තුමන්ලා, තුමියන්ලා, විශේෂයෙන්ම අපේ රංජිත් ඇමතිතුමා කිව්වා වගේ සමාජ සේවා අමාත්‍යාංශයේ

ලේකම්තුමිය ඇතුළු ඒ නිළධාරීතුමන්ලා අපි දැක්කා බෝට්ටුවල නැගගෙන, ඔරුවල නැගගෙන ගිහිල්ලා මේ මහා විශාල කාර්යය භාරයක් කරනවා. ඉතින් ඒ නිසා ඒ සියළුදෙනාටම අපි ගෞරව කරන්න ඕන. අපි ස්තුති කරන්න ඕන. ඒක බොහොම වගකීමෙන් අපි කරන්න ඕන. ඒ අතර වාරයේ යම් යම් අඩුපාඩුකම් සිද්ධ වෙන්න ඇති. ඉතින් ඒ පිළිබඳව අපි සොයලා බලලා ඒ පිළිබඳව යම් ගැටළුවක් තියනවා නම් ඒ පිළිබඳව සාකච්ඡා කරලා අපි කටයුතු කිරීම තමයි මම හිතන්නේ මේ වෙලාවේ වඩා යෝග්‍ය කියන එක මම මේ ගරු සභාවට මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත**

**පළාත් සභාවේ පොදු කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සාකච්ඡා කිරීම සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. මේ වෙලාවේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි අවස්ථාව ලබාදෙනවා.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර..*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සබරගමුව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කර ඉන් අනතුරුව කාරක සභාවට ඉදිරිපත් කර කාරක සභාවේ අනුමැතිය සභාවට ලැබිලා තියනවා. මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා මෙම ප්‍රඥප්තිය සම්මත කරලා දෙන්න. ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මීට පෙර මේ ගරු සභාවට ඉදිරිපත් කරලා ප්‍රඥප්ති කාරක සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව ප්‍රඥප්ති කාරක සභාවේ දී මේ පිළිබඳව විධිමත්ව සාකච්ඡා කිරීමෙන් අනතුරුව තමයි මේ ගරු සභාව වෙත මේ ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ පිළිබඳව යම් අදහසක් දැක්වීමට අවශ්‍යතාවය තියනවා නම් ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැත්නම් මේක සම්මත කර ගැනීම සඳහා ඔබතුමන්ලාගේ එකඟත්වය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනවා. යම් යෝජනා, අදහස් තියනවාද ?

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*
*Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සංශෝධන කීපයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සංශෝධන මම කියවන්නම්. මම හිතන්නේ සියළුදෙනාටම ලැබිලා ඇති. සංශෝධන **2016 අංක දරණ කියන එක සංශෝධනය 2017 වියයුතුයි. 5 (ආ)(2) යටතේ ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ වියයුතුයි. 5(ආ)(3) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරුන් පස්දෙනාගේ නිර්දේශය පරිදි එක් සාමාජිකයෙකු බැඟින් සාමාජිකයින් පස් දෙනෙක්, රාජ්‍ය නිළධාරියෙකු හෝ විෂයය පිළිබඳ දැනුම ඇති නිළධාරියෙකු පත් කිරීම** ලෙස සංශෝධනය වියයුතුයි කියලා මේ සංශෝධන තුන පමණයි ඉදිරිපත් වෙලා තියෙන්නේ සංශෝධන හැටියට.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා, ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමා ඉදිරිපත් කරපු ප්‍රඥප්තිය කලින් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රඥප්ති කාරක සභාවට යොමු කරලා, ප්‍රඥප්ති කාරක සභාවේ දී සාකච්ඡා කරලා, ඒ සාකච්ඡාවේ දී වෙච්ච සංශෝධනත් එක්ක තමයි අවසානයේ දී අද මේ පිළිබඳව සාකච්ඡා කරනවා කියලා අද ඔබතුමන්ලාට ප්‍රඥප්තිය අපි එවලා තියෙන්නේ. ඒ ප්‍රඥප්තිය තුළ තමයි ඒ සංශෝධන ඇතුළත් වෙලා තියෙන්නේ.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

සංශෝධන පිටපතක් එවන්න ඕන.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

සංශෝධන පිටපතක් හැටියට වෙනම ගරු විපක්ෂනායකතුමා, එවලා නෑ. ඔබතුමන්ලාට එවපු ප්‍රඥප්තිය සංශෝධන සහිතව තමයි තියෙන්නේ ඒක. න්‍යාය පත්‍රයත් එක්ක අපි කලින් එවලා තියනවානේ ඒක. අවසානයේ දී මේ ප්‍රඥප්තිය අද සාකච්ඡා කරනවා කියලා ඔබතුමන්ලාට ප්‍රඥප්තිය අපි එවලා තියනවා. ඒ එවපු ප්‍රඥප්තියේ තියෙන්නේ සංශෝධනය කරපු එක තමයි.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර .*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*
*Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්තිය.....

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තියක් ඉදිරිපත් කළාම ඒක කාරක සභාවට ගියාට පස්සේ සංශෝධන තිබෙනවා නම් සංශෝධන වෙනම එන්න ඕන සභාවට. ඊට පස්සේ සභාවේ අනුමැතිය දුන්නාට පස්සේ ප්‍රින්ට් එකට යන්නේ. සංශෝධනත් ප්‍රින්ට් කරලාම මේකට ඉදිරිපත් කරන්න බෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

කාරක සභාවේ තනියම නෙමෙයිනේ. කාරක සභාවේ දෙගොල්ලොම එකතු වෙලානේ සාකච්ඡා කරන්නේ.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

වියයුත්තේ සභාවට ඉදිරිපත් කළාම ප්‍රඥප්තියක් ඒක කාරක සභාවට යොමු කළාම එහේ තියන සංශෝධන මොනවාද කියලා සංශෝධන වෙනම අපට ලැබෙන්න ඕන. පස්සේ තමයි මේක ප්‍රින්ට් එකට යන්න ඕන. ඒක වෙනම එන්න ඕන. කාරක සභාවේ ඉන්න අය ඇරුනාම අනෙක් අය දන්නේ නැහැනේ. දැන් අපි කාරක සභාවේ හිටියේ නෑ. අපි දන්නේ නෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

හරි දැන් මන්ත්‍රීතුමා, අවසාන වශයෙන් දැන් අද මේක සම්මත කරන්නේ නැත්නම් ඒ පිළිබඳව තව ඉස්සරහාට මේකේ කටයුතු යන්න පුළුවන්. සංශෝධනය ඔය අළුතෙන් එවපු එකේ සඳහන් කරලා තියනවා සංශෝධනත් සහිතව. එතකොට ඔබතුමන්ලා කාරක සභාවට ඔක්කෝම සහභාගී වෙන්නේ නැහැනේ. කාරක සභාවට යම් කොටසයි සහභාගී වෙන්නේ. ඉතුරු අයට දැන ගැනීම සඳහා තමයි අපි කල් තියලා මේ ප්‍රඥප්තිය එවලා තියෙන්නේ. ඒ එවපු ප්‍රඥප්තිය ඔබතුමන්ලා කියවලා බැලුවා නම් කලින් ප්‍රඥප්තිය එවපු එකයි, සංශෝධනය මොකක්ද කියන එක පැහැදියි. ඔබතුමන්ලාගේ ප්‍රකාශය මොකක්ද කියන එක කියන්න. ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා තීරණයට එන්න පුළුවන්. මට ප්‍රශ්නයක් නෑ. ඔබතුමන්ලාගේ අදහස කියන්න ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ඒක කරන්න පුළුවන්.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

ඇති කරගත්තු තීන්දුව අපි අනෙකුත් මන්ත්‍රීවරු කවුරුවත් දන්නේ නෑ. මේකේ ඇතුල් කරලා තියනවා කියලා

කියනවා. නමුත් දැන් අපි මේක කියවලා බලලා මේකේ සංශෝධන ඇතුල් වුනා නම් ඒක වෙනම අපට දැනුවත් කිරීමක් වෙන්න ඕන කියන එක තමයි අපේ අදහස.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු විපක්ෂනායකතුමා, ඔබතුමන්ලාට අපි න්‍යාය පත්‍රය එවනවා යම්කිසි කාල සීමාවකට කලින්. න්‍යාය පත්‍රය එක්ක අපි මේක එවලා තියනවා. කලින් ප්‍රඥප්තියත් අපි කලින් එවලා තියනවා. එතකොට කාරක සභාවට සියළුදෙනාම සහභාගී වෙන්නේ නැති බව ඇත්ත. එතකොට ඉතිරි අයට සහභාගී නොවෙන අයට බලාගන්න තමයි ප්‍රඥප්තිය අපි එවලා තියෙන්නේ. එතකොට ඔබතුමන්ලා මේ පිළිබඳව සාකච්ඡා කළයුතුයි කියලා කියනවා නම් ගරු ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා තීන්දුවකට එන්න පුළුවන්. දැන් අපි න්‍යාය පත්‍රයත් එක්ක මේක දවස් 14 කට කලින් එවලා තියනවා, මෙන්න මේක සංශෝධනය කරලා තියනවා කියලා. සංශෝධන පිළිබඳ ප්‍රශ්නයක් තියනවා නම් ඉදිරිපත් කරන්න. තවත් කල් යවනවාද කියන එක.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේකේ සංශෝධන ඉදිරිපත් කරලා තියනවා, සංශෝධන තුනක්. ඒක ගරු විපක්ෂනායකතුමා ඇතුළු කණ්ඩායම ප්‍රඥප්ති කාරක සභාවේ සාකච්ඡා කරලා ගත්ත තීන්දුවක්. ඒ සම්බන්ධයෙන් පැරණි ප්‍රඥප්තිය සහ අළුත් ප්‍රඥප්තිය සඳහන් වුනා නම්, කියවා ගත්තා නම් මේකේ සංශෝධන මොකක්ද කියන එක වටහා ගත්ත හැකි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ගරු විපක්ෂනායකතුමා....

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

විපක්ෂනායකතුමා සහභාගී වෙලත් නෑ.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර..*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------

විපක්ෂනායකතුමා කාරක සභාවේ ඉන්නවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

අපේ දෙන්නයි සහභාගී වෙලා තියෙන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඒක කාරණාවක් නෙමෙයි. ඉන්නේ එක්කෙනයි, දෙන්නයි. ඒ අය සහභාගී වුනේ නෑ කියන එක කාරණාවක් නෙමෙයි.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
-------------------------------------------------------

කාරක සභාවේ ගත්ත තීරණය, අපි පෙත්සම් කාරක සභාවේ ගත්ත තීරණ අපි ඉදිරිපත් කරන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඒක තමයි එවලා තියෙන්නේ. න්‍යාය පත්‍රයත් එක්ක එවලා තියනවා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*** *Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------------

මේ සංශෝධන තුන පරණ ප්‍රඥප්තියෙන් අළුත් ප්‍රඥප්තියට ඇවිල්ලා තියනවා. ඒක ඉදිරිපත් කරලා තියනවා. ඒක ඔබතුමන්ලාට අවශ්‍ය නම් අපි අවස්ථාව ලබාදෙන්නම් මේ පරණ ප්‍රඥප්තියේ සංශෝධන තුන ඔබතුමන්ලාට ඕන නම් නැවත වතාවක් ලැබෙන්න සළස්වන්නම්. ඉන් අනතුරුව ඊළඟ සභා වාරයේ මේක සම්මත කරන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්තිය ඇත්තටම ඉතාම හොඳ ප්‍රඥප්තියක්. ඒ ගැන කිසිම තර්කයක් නෑ. හැබැයි මේක වියයුතු ආකාරය ගැනයි මේ මතක් කළේ. වියයුතු ආකාරය ප්‍රඥප්ති දෙකක් සභාවට දාන්න බෑ. දැන් ප්‍රඥප්ති දෙකක්. ඉස්සෙල්ලා සභාගත කරපු එකයි, මේකයි දෙකක්. සංශෝධනය වෙනම තියෙන්න ඕන. ඒකයි මේ කියන්නේ. මේක මේ තියන පොඩි ගැටළුවක්. ඔබතුමා මම කියන දේ තේරුම් ගන්නවා ඇති. මේ ප්‍රඥප්ති දෙකක් දැන් මේ ඉදිරිපත් වෙලා තියෙන්නේ.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*** *Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------------

මේකේ සංශෝධන වෙනම සභාගත කරන්නම්. එතකොට සම්මත කරලා දෙන්න. ගැටළුවක් නෑ.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------------

පෙර ඉදිරිපත් කරපු ප්‍රඥප්තියට, සංශෝධන මේවා කියලා ඉදිරිපත් වෙන්න ඕන. එහෙමයි එන්න ඕන.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

දැන් ගරු ඇමතිතුමා කියන්නේ මේ පිළිබඳව තවදුරටත් ඔබතුමන්ලාට සාකච්ඡා කළයුතුයි නම් ඒකට ඉඩකඩ දෙන්න. ඒකේ ගැටළුවක් නැ කියන එක එතුමා කියනවා. ඒක අපි වෙනම සාකච්ඡා කරන්න ඕන කාරණාවක්. හැබැයි ඔබතුමන්ලා ගෙන එන තර්කය පිළිබඳව මේ ප්‍රඥප්තිය ඉදිරිත් කරලා තියෙන්නේ බොහොම කාලයකට පෙර මේ ගරු සභාවට. ඊට පස්සේ තමයි කාරක සභාවට මේක ඉදිරිපත් කරලා තියෙන්නේ. කාරක සභාව කියලා කියන්නේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය දෙකෙන්ම සැදුම්ලත් කමිටුවක්. විපක්ෂයේ ඉන්න 14 දෙනාම ඒ කමිටුවේ නැති බව ඇත්ත. ඒ වෙනුවට තමයි නියෝජනයක් ඒකට දාන්නේ. සමහර දාට අපේ යම් යම් මන්ත්‍රීතුමන්ලාට යම් යම් රාජකාරි නිසා සහභාගී වෙන්න බෑ. දැන් මහජන පෙත්සම් කාරක සභාව එහෙම දාපුවාම සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමයි , මමයි තමයි ගොඩාක් වෙලාවට හැමදාම ඉන්නේ. හැබැයි ඉතින් ඒ වුනාට කාරක සභාව අපි පවත්වනවා. ඒ වගේ දේවල් සිද්ධ වෙනවා. ඉතින් ඊළඟට ඒ එවපු ප්‍රඥප්තියයි, මේකයි කියන්නේ ප්‍රඥප්ති දෙකක් නෙමෙයි. ඒ පිළිබඳව බොහොම විධිමත්ව කාරක සභාව තුළ සාකච්ඡා කරලා අද සභාවට ඉදිරිපත් කරලා තියෙන්නේ සභාවට ඉදිරිපත් කළාට පස්සේ. දවස් 14 කට කලින් අපි එවලා තියනවා තමුන්නාන්සේලාට බලලා ඔබතුමන්ලාට මේ පිළිබඳව යම්කිසි සංශෝධනයක් හරි, එවපු සංශෝධනයට යම්කිසි අදහසක් ඉදිරිපත් කරන්න හරි සාකච්ඡා කරන්න අපි කල් තියලා එවලා තියනවා. ඒකත් දැන් ඔබතුමන්ලා කියනවා නම් තවත් කල් ඕන කියලා, ගරු ඇමතිතුමා කියනවා නම් තව කල් දීමේ මට ගැටළුවක් නැ. හැබැයි මේ කියන්නේ මේක අපි එවලා තියනවා. ඔබතුමන්ලාට මේ අද තියන න්‍යාය පත්‍රයට පරි බාහිරව තමයි ප්‍රඥප්තිය අපි එවලා තියෙන්නේ.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක මේ මහා ලොකු දෙයක් නෙමෙයි. අජිත් කුමාර මැද්දේගම මැතිතුමා මතු කරන්නේ ක්‍රමවේදයේ යම්කිසි ගැටළුවක්. ඉතින් අපට මේක ප්‍රශ්නයක් නැ. මේක ලබන සභාවාරයට දාන්නම්. මට එහෙම ලොකු දෙයක් කරගන්න අවශ්‍යතාවයක් නැ.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

සංශෝධන ගැන සාමාජිකයා හැටියටත් මාව දැනුවත් වුනේ නැ. ඒ නිසා ඇමතිතුමා කියනවා ඊළඟ වතාවේ

සංශෝධන පිටපත් අපට එවනවා කියන එක. එය ලැබුනාම අපි ඒ ගැන කටයුතු කරන්නම්.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර .*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*
*Hon. Minister Ranjith Bandara*
*----------------------------------------------------------*

ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්ති කාරක සභාවට විපක්ෂනායකතුමයි, නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමයි තමයි විපක්ෂයෙන් නියෝජනය වෙන්නේ. කොහොම හරි මේ කාරක සභාවට සහභාගී වෙලා තියනවා නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා. විපක්ෂනායකතුමාට සහභාගී වෙන්න අපහසුතාවයක් තිබුණා, පහුගිය කාලයේ එතුමාට ඇති වෙච්ච තත්ත්වයක් තුළ. නමුත් එතුමාගේ ඉල්ලීම තියනවා නම් මේ කාරක සභාවේ මේ ප්‍රඥප්ති කාරක සභාවේ සංශෝධන නැවත වතාවක් මන්ත්‍රීතුමන්ලාට ඉදිරිපත් කරන්න ඒක ඔබතුමාගේ සභා කාර්යාලයෙන් ඒක ඉදිරිපත් කරලා, ලබන සභා වාරයට ඇතුලත් කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මම තව වචනයක් කියන්න ඕන. මොකද කාරක සභාවේ දී ගන්න යම් යම් තීන්දු ඒ කාරක සභාවට සහභාගී වෙන මන්ත්‍රීවරුන්ගේ වගකීමක් තමන්ගේ නායකයාට දැනුම් දීම. දැනුවත් කිරීම. ඔබතුමා විපක්ෂනායකතුමා හැටියට කාරක සභාවේ ඉන්න අනෙක් මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරන්න ඕන මේ සම්බන්ධයෙන්. ඒක සිද්ධ වෙලා නෑ. ඒ ගැන ඔබතුමා පොඩ්ඩක් පැහැදිලි කර ගැනීමක් කරගන්න ඒ මන්ත්‍රීතුමන්ලාගෙන්.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
*----------------------------------------------------------*

ගරු ඇමතිතුමනි, එහෙම නම් ඒ පිළිබඳව අජිත් කුමාර මැද්දේගම ගරු මැතිතුමා මතු කරපු කාරණාව, එතුමා ඉදිරිපත් කරන්නේ මේ ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, කාරක සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒ යම්කිසි සංශෝධන සිද්ධ වුයේ නම් ඒවා වෙනම දැනුවත් කිරීමක් කරන්න. ඉන් අනතුරුව මේක ගේන්න කියලා එතුමා කියන කාරණාව. ඒ පිළිබඳව ගැටළුවක් නෑ. ඒකට එකඟයි අපි. මම කියන්නේ ඒකට එකඟයි. ඒකේ ගැටළුවක් නෑ. දැන් කරලා තියෙන්නේ අපි ඒක මේකට ඇතුළත් කරලාම එවලා තියනවා. ඒ කියන්නේ මේකත් අවසාන දේ නෙමෙයි. ඔබතුමන්ලාට යම් අදහස් ඉදිරිපත් කරනවා නම් ඒකට ඉඩකඩ තියනවා. මම කියන්නේ ඒ කාරණාව දිගට අපි සාකච්ඡා කළයුතු නෑ. ගරු ඇමතිතුමාත් එකඟයි. විපක්ෂනායකතුමාත් එකඟයි. ඒ අනුව අපි ඊළඟ සභාවට ඒක ගන්නවා. හැබැයි එදාට ඔබතුමන්ලා මේක පැහැදිලිව පරණ ප්‍රඥප්තියත් බලලා, අළුත් ප්‍රඥප්තියත් බලලා, කාරක සභාවේ සංශෝධන ටිකත් අපි තමුන්නාන්සේලාට එවන්නම්. ඒකත් බලලා, ඊළඟ එකට සහභාගී වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ගරු මන්ත්‍රී සමිත ආටිගල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/16 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

*ගරු මන්ත්‍රී සමිත ආටිගල*
*கௌரவ உறுப்பினர் சமித ஆடிகல* *Hon.Member Samitha Atigala* --------
-------------------------------------

ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරන යෝජනාව,

**"රත්නපුර දිස්ත්‍රික්කයේ බහුතර ජනතාවගේ ජීවනෝපාය තේ වගාව වන අතර, කුඩා තේ වතු හිමියන් විශාල සංඛ්‍යාවක් ඉන්න දිස්ත්‍රික්කය බවට ද රත්නපුර දිස්ත්‍රික්කය පත්ව තිබේ. රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සඳහා වටපනු රෝගයෙන් විශාල හානියක් මේ වනවිට සිදුවෙමින් පවතී. බලන්ගොඩ ප්‍රදේශයේත් තේ වගාව ආශ්‍රිතව විශාල වශයෙන් මේ වනවිට වටපනු රෝගය බහුලව තිබෙන බවට සොයාගෙන ඇත. බලන්ගොඩ තේ තවාන්වලින් තේ පැල දුර බැහැර ප්‍රදේශවලට ගෙන යෑම නිසා රෝගය අනෙකුත් පෙදෙස් කරාද ව්‍යාප්ත වෙමින් පවතී. බලන්ගොඩ තවාන්වලින් අඩු මිළට තේ පැල අළෙවි කරන බැවින් මෙම අනතුර පිළිබඳව දැන හෝ නොදැන පැල දුර බැහැර ප්‍රදේශවලට රැගෙන යාම සිදුවේ. මෙම රෝගය නිසා තේ ගස්වල පොහොර අවශෝෂණය කරන කිරි මුල්වලට විශේෂයෙන් හානි සිදුවී ගසේ වර්ධනය අඩාල වේ. ජලය මාර්ගයෙන් අවට ප්‍රදේශවලට මෙම රෝගය පහසුවෙන් ව්‍යාප්ත වේ. මේ සඳහා දැනට ප්‍රතිකාරයක් සොයාගෙන නොමැති නිසා රෝග ව්‍යාප්තිය පාලනය කිරීම මඟින් තේ වගාවන් ආරක්ෂා කරගත යුතුව තිබේ. මේ පිළිබඳව තේ වගා කරුවන් දැනුවත් කරන අතර, වෙනත් සුදුසු ක්‍රියා මාර්ග මඟින් වටපනු රෝගය රත්නපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත වීම පාලනය කිරීමට පියවර ගතයුතු බවට යෝජනා කරමි."**

ගරු සභාපතිතුමනි, මේක මධ්‍යම රජයට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් කාර්යය භාරයක්. නමුත් අපි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව සංවේදී පළාත් සභාවක් හැටියට මේ ප්‍රශ්නය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට, ඒ වගේම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට සහ තේ මණ්ඩලයට පැමිණිලි කරලා මේ පිළිබඳව සුදුසු ක්‍රියා මාර්ග ගන්න ඒ අයව පොළඹවන්න ඕන. ප්‍රායෝගික ක්‍රියා මාර්ග ගන්න ඒ අයව දැනුවත් කරන්න ඕන. බලපෑම් කරන්න ඕනි කියන මතය ඇතුව තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඒ වගේම මට අද අපේ නිහාල් ෆාරුක් අපේ පළාත් සභා මන්ත්‍රීතුමා ප්‍රකාශ කෙරුවා රත්නපුරට විතරක් නෙමෙයි කෑගල්ල දිස්ත්‍රික්කයටත් මේ බලන්ගොඩ ප්‍රදේශයෙන් තේ පැල රැගෙන යාම සිද්ධ වෙනවා කියලා. ඉතින් ඒ විදිහට ගත්තාම රත්නපුරේට විතරක් නෙමෙයි කෑගල්ල දිස්ත්‍රික්කයටත්, ඒ වගේම සබරගමුව පළාතටම තේ වගාව සම්බන්ධයෙන් අනාගතයේ දී විශාල බලපෑම් ඇති කරන්න පුළුවන් ප්‍රශ්නයක් බවට මෙය පත් වෙමින් පවතිනවා කියන එක සඳහන් කරන්න ඕන. ඒ වගේම මේ තේ වගාව සම්බන්ධයෙන් මේ පවතින ගැටළුව තේ කර්මාන්ත ශාලා හිමියන්ටත්, ඒ වගේම තේ වතු වගා කරන කුඩා තේ වතු හිමියන්, ඒ වගේම වැවිලි සමාගම්වලට අයත් ප්‍රශ්නයක් පමණක්

හැටියට අපි සළකන්නේ නෑ. තේ වගාව සම්බන්ධයෙන් විශාල ජනතාවක් නියැලී සිටින සබරගමුව පළාතේම විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ මේ සම්බන්ධයෙන් ගැටළු ඇති වෙනවා නම් ඒක අනෙකුත් අංශ කරාත් ව්‍යාප්ත වෙමින් පවතිනවා කියන එක සඳහන් කරන්න ඕන. තේ වගාවේ වර්ධනය සහ පරිහානිය කෙලින්ම රත්නපුර දිස්ත්‍රික්කයේ, ඒ වගේම සබරගමුව පළාතේ කඩ සාප්පු හිමියන්ටත් බලපාන ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ කඩ සාප්පු හරි ආකාරව පවතින්නේ, හරි ආකාරව ගණුදෙනු සිද්ධ වෙන්නේ මේ තේ වගාවේ උන්නතියත් සමඟ කියන එක සඳහන් කරන්න ඕන. ඒ විතරකුත් නෙමෙයි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලී සිටින ජනතාවටත් මේ තේ වගාවේ උන්නතිය සහ පරිහානිය ඒ අයගේ ආර්ථිකයටත් බලපෑම් ඇති කරනවා. තේ වගා කරුවන් අතර මුදල් ගැවසෙනකොට ඒ මුදල් අනෙකුත් අංශ කරා ව්‍යාප්ත වෙමින් පවතිනවා. ඉතින් ඒක ඒ විදිහට සළකනකොට මේක තේ වගා කරුවන් අතර පවතින ගැටළුවක් නෙමෙයි. සමස්ත ආර්ථිකය පුරාම බලපෑම් ඇති කරන ප්‍රශ්නයක් බවට පත් වෙනවා.

ඒ වගේම තේ වගාව සම්බන්ධයෙන් කථා කරනවා නම් මේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ලබාදෙන වගාව හැටියට තේ වගාව ප්‍රචලිතයි. තේ වගාවට යම් හානියක් සිද්ධ වෙනවා නම් ඒක රටේ ආර්ථිකයටත්, රටේ විදේශ විනිමය උපයා ගැනීම සම්බන්ධවත් අනාගතයේ දී සෘජු බලපෑමක් ඇති කරන ප්‍රශ්නයක් බවට මේක පත් වෙනවා කියන එක සඳහන් කරන්න ඕන. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ තේ වගාව සම්බන්ධ මේ ගැටළුවත් එක්කම මේ තේ වගාවට බලපාන තවත් ප්‍රශ්න ගණනාවක් තියනවා. ලංකාවේ තේ වගාව ගත්තොත් එහෙම ජපානය වගේ රටවල් ලංකාවේ තේ මිළදී ගන්නෙ නෑ. ඒකට හේතුව හැටියට දක්වන්නේ අති විශාල වශයෙන් රසායනික වල් නාශක භාවිතා කරනවා. ඒ වගේම පොහොර භාවිතා කරන නිසා ජපන් ජාතිකයෝ මේ තේ පරීක්ෂා කරලා මේ තේ මිළදී ගැනීමෙන් ඒ අය වැළකී සිටිනවා. ඉතින් අන්න ඒ පිළිබඳව අපි කථා කරනකොට අපි ස්තූතිවන්ත වෙන්න ඕන වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හානිදායක වල් නාශක තහනම් කරන්න කටයුතු කළා. ඉතින් ඒක පිළිබඳව අපි එතුමාට ස්තූතිවන්ත වෙනවා, ඒ විදිහේ පියවරක් ගැනීම සම්බන්ධයෙන්. ඒ වගේම තේ ගැන කථා කරනකොට ගරු සභාපතිතුමනි, තේ වල ලෝක වෙළඳ පොළ තියෙන්නේ වෙනත් රටවල්වල නෙමෙයි ලංකාවේ තමයි ලෝක වෙළඳපොළ තියෙන්නේ. ලෝක වෙළඳ පොළේ ගණුදෙනු සිද්ධ වෙන්නේ බ්‍රෝකර් සමාගම් කීපයක් හරහා. ඉතින් අපි විශ්වාස කරනවා ඒ බ්‍රෝකර් සමාගම් කීපයත් සමඟ ගණුදෙනු කරනකොට ඒ මිළේ වාසිය තේ කර්මාන්ත ශාලා වලටවත්, තේ හිමියන්ටවත් ලැබෙන්නේ නෑ, ඒකාධිකාරී වෙළඳ පොළක් පැවතීම නිසා. ඒ වගේම ඒකාධිකාරී වෙළඳ පොළ ගැන කථා කරනකොට අපට මතක් වෙන්නේ ලලිත් ඇතුලත්මුදලි හිටපු වෙළඳ ඇමතිතුමා ගැන. එතුමා පිටකොටුවේ තොග වෙළඳුන්ගේ තිබෙන ඒකාධිකාරී ස්වභාවය අහෝසි කරන්න කටයුතු කළා. ඒකේ ප්‍රතිඵලය වුනේ ස්ථාවර මිළක් යටතේ, පහළ මිළක් යටතේ ස්ථාවර මිළකට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදෙන්න හැකියාව ලැබීම. ඒ වගේම අපි විශ්වාස කරනවා ලෝක තේ වෙළඳ පොළේ ඒ බ්‍රෝකර් සමාගම් සතුව තිබෙන ඒ ඒකාධිකාරී ස්වභාවය අහෝසි කරන්න රජයට හැකියාවක් තිබෙනවා නම්, උවමනාවක් තිබෙනවා නම් ඒ සඳහා ශක්ති සම්පන්න විදිහට මැදිහත් වෙන්න හැකියාවක් තිබෙනවා නම් තේ මිළ ඉහළ දැමීමේ හැකියාවත් තියනවා කියන විශ්වාසය අපි තුළ තියෙනවා. ඒ වගේම

තේ සම්බන්ධයෙන් කථා කරනකොට කසළ තේ ගැනත් කථා කරන්න ඕන. කසළ තේ කියන එකත් විශාල බලපෑමක් තේ සම්බන්ධයෙන් ඇති කරනවා. ඒක රාජ්‍ය මට්ටමින් හරි ආකාරව මැදිහත් වෙලා ක්‍රියාත්මක වුනත් මේ පිළිබඳව සතුටුදායක තත්ත්වයකට පත්වෙලා නෑ කියන එක සඳහන් කරන්න ඕන. ලංකාවේ තේ කියන්නේ ඖෂධීය පානයක් හැටියට ප්‍රසිද්ධයි. නොයෙකුත් රෝගවලට තේ විසඳුමක් හැටියට, ප්‍රතිකාරයක් හැටියට යොදා ගැනීමේ හැකියාව තියෙනවා. නමුත් මේ අපි පාවිච්චි කරන කසළ තේ වලින් නම් කවදාකවත් යහපතක් සිද්ධ වෙයි කියලා, සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරනවා විනා කවදාවත් තේ වල තියන ඖෂධීය ගුණය ලබාගන්න හැකියාවක් ලැබෙන්නේ නෑ.

ඒවගේම මේ රටේ බහුතර ජනතාවක් පාවිච්චි කරන්නේ අපි විශ්වාස කරන ආකාරයට කසල තේ . මේ කොහේ ගියත් පාවිච්චි කරන්න ගන්න තේ වලින් නරකක් සිද්ධ වෙනවා කියන එක සෞඛ්‍යට හිතකර නොවන චිත්තිය සඳහන් කරන්න ඕනේ. ඒවගේම ගරු සභාපතිතුමනි සඳහන් කරන්නට ඕනේ පසුගිය මැතිවරණ කාලයේදී 2015 මැතිවරණ වෙලාවේදී අමු තේ දළු කිලෝ එකකට රු.85/- ක මුදලක් ලබා දෙන්නට එක්සත් ජාතික පෙරමුණ රජය පොරොන්දු වුණා. නමුත් මේ වන කොට අමු තේ දළු කිලෝ එකකට රු.85/- ක් පමණක් නෙමෙයි රු.100/- ට ආසන්න මුදලක් සමහරක් ප්‍රදේශවල කර්මාන්ත ශාලාවලින් සියය ඉක්මවා ගිය මුදලක් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ පිළිබඳ අපි වර්තමාන වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමාට අපේ ස්තුතියි පුද කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා. ඒවගේම තේ සම්බන්ධයෙන් කතා කරන කොට නැවත තේ වගාව සඳහා ලබාදෙන ආධාර මුදල් වැඩි කරන්න වර්තමාන අමාත්‍යවරයා නවීන් දිසානායක ඇමතිවරයා කටයුතු කිරීම සම්බන්ධයෙනුත් අපි එතුමාට ස්තුතිය පුද කරන්න අපි මේක අවස්ථාවක් කර ගන්නවා. ලංකාවේ තේ වගාව ගැන කතා කරන කොට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් විශාල කාර්යය භාරයක් සිද්ධ වෙනවා. ඒ පිළිබඳ අපිට සෑහීමට පත් වෙන්න පුළුවන්. නමුත් මේ රටේ තේ කර්මාන්තය පාලනය කරන ආයතනය තමයි තේ මණ්ඩලය . තේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නම් කිසිසේත්ම සතුටු වෙන්න බැහැ කියන එක සඳහන් කරන්නට ඕනේ. අපි දන්නවා යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන ගිහිල්ලා ඒක වැහුවට පස්සේ කුඩා තේ වතු හිමියන්ට මුදල් ලබා දෙන්න තියෙනවා නම් තවත් පුද්ගලයෙක් ඒ කර්මාන්ත ශාලාව ආරම්භ කරනවා නම් ඒ හිඟ මුදල් තැන්පත් කරන්නේ තේ මණ්ඩලයේ. ඒ විදිහට තැන්පත් කරන මුදල් හිමි වෙන්න ඕනේ ඒ තේ වතු හිමියන්ට ඒ ලැබෙන්න ඕන මුදල් තමයි අලුතින් පටන් ගන්න කර්මාන්ත ශාලා හිමියෝ ඒ තේ මණ්ඩලයේ තැන්පත් කරන්නේ. නමුත් මේ වෙන කොට අවුරුදු හතක් අටක් ගිහිල්ලාත් ඒ තැන්පත් කරන මුදල් තේ වතු හිමියන් වෙත ලබා දෙන්න තේ මණ්ඩලය කටයුතු කරලා නැහැ. ඒ අනුව ගත්තහම තේ මණ්ඩලයේ සමහරක් නිළධාරීන්ගේ ක්‍රියා කලාපය ඉතාමත්ම කණගාටුදායකයි කියලා සඳහන් කරන්න ඕනේ. තේ මණ්ඩලය වර්තමානයේ පවත්වාගෙන යන්නේ අන්න එවන් තත්වයක ඒ විදිහට සලකන විට තේ මණ්ඩලය හොර ගුහාවක් බවට පත් වෙලා තියෙනවා කියන ප්‍රකාශයත් කියන්නට සිද්ධ වෙනවා. අන්න ඒවගේ වාතාවරණයක් යටතේ තමයි තේ කර්මාන්තය මේ වෙන කොට පවතින්නේ. අපි ජනතාවගේ

ප්‍රශ්න පිළිබඳව සංවේදී පළාත් සභාවක් හැටියට ප්‍රශ්න වර්තමාන අමාත්‍යතුමාට ,වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මේ ප්‍රශ්න දැනුවත් කරලා මේ සඳහා ප්‍රායෝගිකව විසඳුම් ලබාගන්න කටයුතු කරන්න ඕනේ කියන අදහස යෝජනාව ඉදිරිපත් කරමින් අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමාට. මීළඟට යෙහෙයියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහම අපේ නිතිඥ සමිත ආටිගල සහෝදර ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව රත්නපුර දිස්ත්‍රික්කයේ බහුතර ජනතාවගේ ජීවනෝපාය මාර්ගය වන තේ කර්මාන්තය මේ තේ කර්මාන්තය සම්බන්ධයෙන් මේ වනවිට පවතින ගැටළු සහ වර්තමාන තත්ත්වය පිළිබඳ ඉතාමත්ම හොඳ අවබෝධයක් සහ අතීතය ,වර්තමානය, ඒවගේම අනාගතයේදී මේ සඳහා අපිට කළ හැකි ක්‍රියාවන් මේ වනවිට මතුවී ඇති ප්‍රශ්න පිළිබඳ එතුමා ඉතාමත්ම කරුණු සාධක ඇතුව ඉදිරිපත් කරනු ලැබුවා. මම ඒ යෝජනාව එකහෙලාම ස්ථිර කරමින් ගරු සභාපතිතුමනි මෙවැනි දේවල් අපිට සිදු වෙන කොට අපේ තියෙන දෙයක් තමයි අපි යමක් කිව්වහම ඒ සියල්ල අසාගෙන ඉඳලා ඒ සියල්ල අපි කතා කරනවා. කතා කරලා අද දිනයෙන් බැහැරව ගියාට පස්සේ නැවත ඒක ඒ විදිහටම අමතක වෙලා යනවා. මේක කතාවට පමණක් සීමා වෙනවා. ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සිදු වෙනවා නම් අද මේ දේ සිද්ධ වෙන්නේ නෑ. හොඳම උදාහරණය තමයි මේ මොහොතේ මීට ඉස්සෙල්ලා අපේ අසෝක ජයවර්ධන අපේ සභානායකතුමා කිව්වා දින දහයකට ඉහතදී මේ ගෞරවනීය සභාවටම මීට දින කීපයකට ඉහතදී සිද්ධ වෙච්චි සිදුවීමක් සම්බන්ධයෙන් අපේ නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ යෝජනාවක් ගෙනල්ලා සාකච්ඡා කළා. එදා කරපු යෝජනාව යම් හෙයකින් අපි පිළි අරගෙන ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් අරගෙන කටයුතු කළා නම් පහුගිය කාලයේ සිදු වෙච්ච මැයි මාසයේ 26 වෙනිදා සිදු වෙච්ච ධාරානිපාත වර්ෂාව නිසා ඇති වෙච්ච නායයෑම හා ගංවතුර උවදුරෙන් යම් ප්‍රතිශතයක් අපිට පුළුවන්කමක් ලැබුණා යම් දෙයක් කර ගන්න තිබුණා. නමුත් ඒක නැති වී ගියේ එදා සාකච්ඡා කළා මේ පිළිබඳ අදහස් ප්‍රකාශ කළා ඉන් අනතුරුව අපි විසිර ගියා. ඉන් ගත්ත ක්‍රියාමාර්ගයක් නොමැති වුණා. අද මේ ගෞරවනීය සභාවට අපේ හිතවත් සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව දැක්කහම මේ ප්‍රදේශයේ ජීවනෝපාය මාර්ගය තමයි කුඩා තේ වතු හිමියන්ගේ සහ කුඩා තේ වතු කර්මාන්තය . මේ කර්මාන්තයේ යෙදී සිටින බහුතරයක් කෘෂිකාර්මික ජීවනෝපාය මාර්ගය වන උදවියගේ

තමන්ගේ සියළු කටයුතු ගත්තහම බහුතරයක් ජීවත් වෙන්නේ මේ කුඩා තේ වතු හිමියන් වන අර මේ සම්බන්ධයෙන් මේ උවදුර පැතිර යන මේ රෝගී තත්ත්වය සහ මේ විවිධ කටයුතු නිසා ඇති වී තිබෙන අපහසුතාවයන් අපි විවිධ ක්‍රියාමාර්ග ගත්ත හැකියි. අපි දැනුවත් වුණහම එතුමා කිව්වා කසල තේ කර්මාන්තය. ඒවගේම අපි මේ වන කොට භාවිතා කරන තේ. ඒවගේම ලෝකයේ ඉහළම මිළක් ගන්න පුළුවන් ඖෂධීය ද්‍රව්‍යයක් තමයි අපේ තේ කර්මාන්තය. නමුත් අද එදා තේ කර්මාන්තය එදා ගියහම ලෝකයේ ශ්‍රී ලංකන් ටී කිව්වහම විශාල පිළිගැනීමක් තිබුණා. අද පැහැදිලිවම ගත්තහම එදා සීලෝන් ටී කියන ගෞරවය අද අපෙන් ටිකෙන් ටික ඈත් වෙලා තියෙන්නේ ඇයි. විවිධ දේවල් පිටස්තර තැන්වලින් ගෙනල්ලා මෙහේ මිශ්‍ර කරලා කසල තේ උපයෝගී කරගෙන ඉතාමත්ම තේ කර්මාන්තයට අහිතකර දේවල් භාවිතා කිරීම තුළ තමයි මේ කර්මාන්තය ටිකෙන් ටික අපෙන් ගිලිහී යන තත්ත්වයට සහ අපේ තියෙන මිළ ඉහළ යාමට සහ පහළ යාමේ තත්ත්වයට පත් වුණා. අද නැවතත් අපි යම් හෙයකින් මිළ ඉහළ යාමක් දකිනවා. මේ දේවල් තේ කර්මාන්තයට හොඳ කල දසාවක් ඉදිරියේදී දැක්මක් තියෙන මොහොතක තමයි ඉන්නේ. ඒ එක්කම මේ කාල පරිච්ජේදයේදී එක දෙයක් කියන්නට ඕනේ තේ කර්මාන්තය නිසාම තමයි සමහර තැන් නාය යෑමට ලක් වෙලා තියෙන්නේ. හරියාකාරව නිසියාකාරව තමන්ගේ කර්මාන්තය හරි විදිහට කටයුතු නොකිරීම නිසා. ඒවගේම විවිධ දේවල් භාවිතා කිරීම නිසා නාය යෑමට සිදු වෙලා තියෙන සමහර අය මේ කියන කොට වරදින්නට පුළුවන්. වෙන විදිහක හිතන්න පුළුවන්. ඩොලමයිට් දැමීම,යූරියා දැමීම. ඒවගේම පස ඉහළ කඳුකරයේ තමයි තේ ආර්ථිකය තිබෙන්නේ. එතකොට අපි පස විවිධ දේවල් උපයෝගී කරනවා. ඒ උපයෝගී කිරීම නිසා තේ ආර්ථිකයට පස බුරුල් කිරීම සඳහා විවිධ පොහොර වර්ග භාවිතා කරනවා. භාවිතා කළහම සමහර කර්මාන්තය මේ නාය යෑමට එක උදාහරණයක් වෙලා තියෙනවා. අපි දැන ගත යුතුයි. මේ පිළිබඳව අවබෝධ කරගත යුතුයි. මොකද මම මේ කියන කොට දෙපැත්තක් තියෙනවා කාසියේ වගේම. එකක් තමයි ආර්ථිකය ශක්තිමත් වෙනවා. ආර්ථිකයට හොඳයි. නිෂ්පාදනයට හොඳ මිළක් ලැබෙනවා. ඒවගේම ඒවා නිසි ප්‍රමිතියට නිෂ්පාදනය කළ යුතුයි. ඒවගේම තමයි මෙවැනි දේවල් සිදු කරන ස්ථාන තිබෙනවා ඉස්සර නම් අපි ගෙවල් ඉස්සරහා මල් පැළ හැඳුවහම නම් මල් පැළ හදන්නේ නෑ තමන්ගේ පෞද්ගලික ආර්ථිකය තකා තේ හිටවනවා දැනුත්. මෙන්න මෙහෙම තමයි අද ආර්ථිකයේ ලාභ ප්‍රයෝජනය සඳහා දෛනිකව එදාවේල ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ කටයුතුවල යෙදෙනවා. නමුත් අද අපි දකිනවා, මම දැක්කා අපේ සමිත ආටිගල මන්ත්‍රීතුමා ඉතා හොඳ මේ පිළිබඳ අදහස් ප්‍රකාශ කළා. ඒ අදහස තුළ ගැඹුරින් අපි හිතන්න ඕනේ. අද මෙතනින් මේක සාකච්ඡා කරලා අවසන් කරන එක නෙමෙයි. මේක එකක් තමයි අපේ ආර්ථිකයට අවශ්‍යයි. අනිත් පැත්තෙන් මේකෙන් යම් හානියක් වෙනවා නම් ඒ හානිය අවම කර ගන්න අපි වැඩ පිළිවෙලක් කරන්න ඕනේ. මේ පිළිබඳව දැනුවත් කළ යුතු ආයතන සියල්ලම දැනුවත් කරලා මෙය මේ මොහොතේ සිට අපි යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට උත්සාහ කළ යුතු බව ප්‍රකාශ කරමින් මට අවස්ථාව සලසා දුන් ගරු සභාපතිතුමනි ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නැවත වතාවක් අපේ සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් අපිට යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට මේ කුඩ තේ වතු හිමියන් රැක ගැනීමටත් ඒ තුළින්

තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමටත් ඒවගේම අපේ මේ භූමිය රැක ගැනීමටත් ශක්තිය,ධෛර්‍යය ,වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු යෙහෙයියා එම්.ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට. මීළඟට අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන යෝජනාවේ පළවෙනි කැල්ල මම අනුමත කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ බහුතර ජනතාවගේ ජීවනෝපාය තේ වගාව වන අතර කුඩා තේ වතු හිමියන් විශාලතම සංඛ්‍යාවක් සිටින දිස්ත්‍රික්කය බවට ද පත්ව තිබේ.

රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සඳහා වටපණු රෝගයෙන් විශාල හානියක් මේ වනවට සිදු වෙමින් පවතී. බලංගොඩ ප්‍රදේශයේ තේ වගාව ආශ්‍රිතව මෙම රෝගය බහුලව පවතින බවට සොයා ගෙන ඇත. එතෙක් ඔබතුමාගේ යෝජනාව මම ස්ථිර කරනවා ගරු සභාපතිතුමනි. නමුත් එතනින් එහාට මේ යෝජනා කරන බලංගොඩ තේ තවාන්වල මේ රෝගය තියෙනවා කියන එක කිසිම ආයතනයක කිසිම විද්‍යාත්මකව කොහේවත් ලියවිලා නෑ. මේ රෝගය වැළඳිලා තියෙන්නේ බලංගොඩ ප්‍රදේශයේ අවුරුදු 15,20 ක් පරණ තේ ගස්වල පමණයි. විශේෂයෙන් වලේබොඩ ප්‍රදේශයේ තමයි මේ රෝගය වැළඳිලා තියෙන්නේ. ඒ නිසා මේ රෝගය අවුරුදු 20 ක් පමණ පැරණි ගස්වල තමයි මේ රෝගය තියෙන්නේ. නමුත් කවදාකවත් අපේ තේ ව්‍යාපෘති නිළධාරීන් ඉන්නවා මේ නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ තමයි මේ සියළු වගාවන් සිද්ධ වෙන්නේ. එතකොට අවුරුදු 15 ක් 20 ක් පරණ වතුවල මේ තියෙන එකම ප්‍රතිකර්මය තමයි මේ ගස් ගලවන්න ඕනේ. නැවත පැළ සිටුවීමක් කරන්න ඕනේ. මේ සඳහා ප්‍රථමයෙන්ම බැසිමික් කියන රසායනික ද්‍රව්‍ය පොළවට පතිත කරලා ටික කාලයක් තියලා ඊට පස්සේ ගෝතමානා කියන ශාක වර්ගය වැල් වර්ගයක් කාලයක් පොළොවේ තිබුණට පස්සේ තමයි නැවත වගා කිරීමක් කරන්න වෙන්නේ. මේ රෝගය හැදෙන්නේ පසෙන් මිසක් වෙන කොහෙන්වත් නෙමෙයි ඔබතුමා කිව්වා ජලය ආශ්‍රිත ප්‍රදේශවලින් තමයි මේ රෝගය වැළදෙන්නේ. නමුත් මෙතෙක් කල් සොයාගෙන තියෙන දත්ත අනුව මේ රෝගය වැළදෙන්නේ පසෙන්. අඩි එක හමාරක් දෙකක් පල්ලෙහාට එනකන් පසෙන් තමයි මේ බැක්ටීරියා වර්ගය රඳා පවතින්නේ. නමුත් ගරු සභාපතිතුමනි අපි දන්නවා අලුත් තේ වගාවට පැළ තවාන් කරන කොට අපි පස් ගන්නේ උඩ තියෙන පස් නෙමෙයි ගන්නේ. අඩි පහක් හයයි යට හාරලා තමයි ඒ පස ගන්නේ. ඒ පස තුළ මේ බැක්ටීරියා වර්ගය නෑ. ඒක තමයි විද්‍යාත්මකව දැනට සොයාගෙන තියෙන දේ. ඒ නිසා බලංගොඩ ප්‍රදේශයේ සාමාන්‍ය කාලයකදී පැළ කෝටියක් එක හමාරක්

වගේ ප්‍රමාණයක් පැළ තවාන් දානවා. ජනතාවගේ විශාල වශයෙන් ස්වයං රැකියාවක් විදිහට වශයෙන් වසම් අටකට දහයකට ආසන්න ජනතාවකගේ ස්වයං රැකියාවක් විදිහට තමයි මේ කටයුතු සිද්ධ වෙන්නේ. ජනතාව මේ ජීවත් වෙන්නේ මේ පැළ තවාන් වලින්. නමුත් මේ අසත්‍ය ප්‍රකාශන මගින් ජනතාවගේ මේ ජීවනෝපායට අවුලක් වෙනවා මිසක් අපේ අගමැතිතුමාත් කියනවා රැකියා ලක්ෂ දහයක් මේ රටේ අලුතින් බිහි කරනවා කියලා. මේ රැකියා ලක්ෂ දහය බිහි කරන කොට මේ වගේ තියෙන ස්වයං රැකියා වලටත් පහර ගහන්න සිද්ධ වුණොත් එහෙම අපේ ගරු අගමැතිතුමාගේ අභිලාශය කරා ඉලක්ක කරා යන්න බැරි වෙනවා. මේ රෝගය කිසිම ආකාරයකින් බලංගොඩ පැළ තවාන්වල නෑ කියන එකත් මම ඒක 100% තහවුරු කරනවා. ඒ චෝදනාව අද ඊයේ නෙමෙයි මේ අවුරුදු ගාණක ඉඳන් බලංගොඩ පැළ තවාන් වලට එන චෝදනාවක්. මේ තුළින් බලංගොඩ ආසනයේ පැළ තවාන් කරන ජනතාවගේ ආර්ථිකය මහත් ලෙස පහත බැහැලා තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම ඉතාමත් වැදගත් මේ අවස්ථාවේදී. මොකද මට අවස්ථාවක් ලැබුණා මේ අවස්ථාවේදී අපේ මේ ගොවි මහත්තුරුන් ගැන කතා කරන්න. ඒවගේම ඔබතුමා කිව්වා ග්‍රයිෆොසෙට් වගේ කෘෂි රසායනික ද්‍රව්‍ය අතිගරු ජනාධිපතිතුමා විසින් තහනම් කරලා තියෙනවා. බොහොම ස්තූතිවන්ත වෙනවා මේ අතිගරු ජනාධිපතිතුමා තහනම් කරලා තියෙනවා නම්. අදටත් වෙළඳ පොළේ එක එක නම් වලින් පාරිභෝගිකයින්ට ග්‍රයිෆොසෙට් කියන කෘෂි රසායන ද්‍රව්‍ය මිළදී ගැනීමේ හැකියාව තියෙනවා. ඕනම තැනක. මට නම් ආරංචි වෙලා තියෙන විදිහට අවුරුදු දහයකට මේ අවශ්‍ය ප්‍රමාණයට මේ ග්‍රයිෆොසෙට් කියන මේ රසායන ද්‍රව්‍ය ලංකාවට ඇවිල්ලා තියෙනවා. නමුත් අද ගෙනාවට පස්සේ තහනම් කරලා තියෙනවා. තහනම් කිරීමත් සමඟ අද ඕනම වෙළඳ පොළක මෙය ලබා ගන්න පුළුවන්. මේ එක් එක් පාරිභෝගිකයාට ලැබෙන්නේ එක එක මිළ ගණන් යටතේ. ඒක අපි වගා කරන පුද්ගලයින් හැටියට අපි ඒක දන්නවා. ඒවගේම ඔබතුමා කිව්වා තේ මිළ සම්බන්ධව තේ මිළ වැඩි වෙලා. ස්තූතිවන්ත වෙනවා රජයට. නමුත් මේ වැඩි වෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි රජයේ තියෙන මොකක් හරි වැඩ පිළිවෙලක් යටතේ නෙමෙයි කියලා මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ. මොකද මේ වැඩි වෙලා තියෙන්නේ රුපියල අවප්‍රමාණය කිරීමත් සමඟයි. එදා 128/-ට තිබුණ රුපියල අද ඩොලරය රු.154/- දක්වා වැඩි වෙලා තියෙනවා. ඉතිං මේ තුළ ඒ වෙනස තමයි අපිට තියෙන්නේ අපේ බලංගොඩ ප්‍රදේශයේ ජනතාවට තේ කිලෝවකට ලැබුණා රු.80/- ක් රු.85/- ක් අතර. දැන් ලැබෙනවා රු.95/- ක්. ඒ ලැබෙන්නේ ඩොලරයේ අවප්‍රමාණය මිසක් නැතුව මේ රජයෙ වැඩ පිළිවෙලේ ලැබිච්ච සහනයක් නෙමෙයි. රුපියල් දහයක් වැඩි වුණාට තේ කිලෝවකට ලැබෙන මුදල ඒ සඳහා පොහොර සහනාධාරය නෑ අපිට. එදා රු.1000/- කට ගත් පොහොර මිටිය අද රු.3000/- යි. එතෙන්ට ගියාට පස්සේ ලැබෙන සහනාධාරය සහනය ගොවියාට කිසිත් වැඩක් නැති වෙනවා. ඒ නිසා මේ කර්තව්‍යයන් වගේම අද අපේ සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා කිව්වා ජපානය වගේ රටවල්වල අපේ තේ ප්‍රතික්ෂේප කරනවා රසායනික ද්‍රව්‍ය නිසා . ඉතාමත් හොඳ යෝජනාවක් අපි ඒ පිළිබඳව රටක් හැටියට අපේ ප්‍රධාන ආර්ථික සංධිස්ථානයක් තමයි තේ වගාව කියන එක. තේ අපනයනය. අපි ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න ඕනේ කියමින් නැවතත් කියා සිටින්නේ බලංගොඩ තේ තවාන්වල මෙම රෝගය වැළඳී නැති බවට 100% තහවුරු

කරනවා. මම නෙමෙයි තේ ව්‍යාපෘති නිළධාරීන්. එහෙම මොනවා හරි ප්‍රශ්නයක් තියෙනවා නම් තේ ව්‍යාපෘති නිළධාරීන්ගේ අධීක්ෂණය, අවධානය සහ අනුමැතිය මත අපිට ඕනම තීන්දුවකට අධිකරණයටත් යන්න පුළුවන්. එසේ නොවන බවට බලංගොඩ තේ තාවාන්වල බැක්ටීරියාව නොමැති බව මට තහවුරු කිරීමේ හැකියාව තිබෙනවා. එසේ කියමින් මේ විවාදයට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්. මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට. මීළඟට අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී සමිත ආටිගල*
*கௌரவ உறுப்பினர் சமித ஆடிகல* *Hon.Member Samitha Atigala* --------
-----------------------------------

ගරු සභාපතිතුමනි පොඩි පැහැදිලි කිරීමක් කරන්න. අපිට මේ පිළිබඳව දැනුවත් කළේ මේක මගේ පුද්ගලික යෝජනාවක් හැටියට ගෙනාවට මේ මගේ පුද්ගලික මතයක් නෙමෙයි. මේ පිළිබඳව අපිට දැනුවත් කළේ රත්නපුර තේ පර්යේෂණ ආයතනය ඒ පරීක්ෂක නිළධාරී මහත්තුරු ආචාර්ය උපාධිය පවා තියෙන මහත්තුරු තමයි අපිට මේ පිළිබඳව දැනුවත් කළේ . දැනුවත් කරලා අපෙන් ඉල්ලීමක් කළා මේ සම්බන්ධයෙන් යෝජනාව ඉහළට අරගෙන යන්න කියලා ඒ සම්බන්ධයෙන් තමයි අපි මේ පළාත් සභාවටත් මේ යෝජනාව ගෙනාවේ. නැතුව පුද්ගලික අදහසක් නෙමෙයි. රත්නපුර හිදැල්ලන තේ පර්යේෂණ ආයතනය ආචාර්ය උපාධි තියෙන මහත්තුරුන්ගේ උපදෙස් අනුව තමයි මේ යෝජනාව ගෙනාවේ කියන එක සඳහන් කරන්න ඕනේ.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---------------------------------------------------------

මම කිව්වේ බලංගොඩ තේ ව්‍යාපෘති නිළධාරීන් ඉන්නවා . මේ නිළධාරීන් විසින් කිසිම තැනක මෙවැනි රෝගයක් දිලීරයක් තියෙනවා කියලා කිසිම ආයතනයක පොතක ලියවිලා නෑ. ඒ නිසා කොහේ හරි චෝදනාවක් තියෙනවා නම් එහෙම පැළ තවාන්වල දිලීරය තියෙනවා බැක්ටීරියාවක් තියෙනවා කියලා චෝදනාවක් තියෙනවා නම් කරුණාකරලා අපිට නිළධාරීන් දැනුවත් කරන්න. එතකොට එහි සාධාරණත්වයක් තියෙනවා. නමුත් එහෙම කිසිම තැනක නැතුව ඔබතුමාව දැනුවත් කරපු නිළධාරී මහත්තුරු කවුද කියලා මම දන්නේ නෑ. නමුත් එතුමාගෙන් අහන්න මෙහෙම විද්‍යාත්මකව කොහේ හරි තැනක බලංගොඩ තේ තවාන්වල ලියවිලා තියෙනවාද මෙහෙම බැක්ටීරියා තියෙනවා කියලා. එහෙම නම් අපි පිළිගන්නවා. මම කිව්වා අවුරුදු පහළොවක්, විස්සක් පැරණි ගස්වල කියලා. එහෙම නැතුව තේ තවාන් කියන එකයි. අවුරුදු පහළොවයි විස්සයි කියන එක අතරේ

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

හරි අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම***
***கௌரவ உறுப்பினர் அஜித் குமார மெத்தேகம***
*Hon.Member Ajith Kumara Meddegama*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ යෝජනාව පිළිබඳව අදහස් දෙකක් තිබෙනවා. ගරු සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් අපේ අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ අදහසුත් බැලුවහම මේක පරස්පරතාවයක් තිබෙනවා. කෙසේ වෙතත් ලොකු ආර්ථිකයක් තිබෙනවා බලංගොඩ ප්‍රදේශයේ. මේ කලාපයේ මේ තේ පැළ අලෙවි කරන එකෙන්. අපි ටිකක් කල්පනාකාරීව තමයි අපි මේ ප්‍රශ්නය දිහා බලන්නට සිද්ධ වෙන්නේ. විශේෂයෙන් සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා සත්භාවයෙන් ඉදිරිපත් කරපු යෝජනාව. ඒවගේම එතුමාට ලැබිච්ච තොරතුරු තේ පර්යේෂණ ආයතනයේ නිළධාරීන්ගෙන් ලැබිච්ච තොරතුරු අනුව ඉදිරිපත් කරපු යෝජනාවක්. එහෙම නැතුව එතුමා බලංගොඩට ලොකු සම්බන්ධයකට ඉදිරිපත් කළා නෙමෙයි. ඒවගේම තේ පර්යේෂණ නිළධාරී මහත්තුරු විසින් බලංගොඩ ප්‍රදේශයේ ඒ අධීක්ෂණ කටයුතු කරලා වාර්තාවක් ඉදිරිපත් කරලා නැත්නම් එහෙම තිබියදී එහෙම ආපු එක ප්‍රශ්නයක්. කෙසේ වෙතත් අපි ඒ ගැන ටිකක් දීර්ඝ වශයෙන් වාද කිරීම එච්චර සුදුසු නෑ කියලාත් මට හිතෙනවා. එක පැත්තකින් විශාල ආර්ථිකයක් තිබෙනවා බලංගොඩට. මේ සම්බන්ධව මේ වැහි යන්තන් පටන් ගන්න කොට ලොරි පනහක්,හැටක් මේ දවසකට කිරිමැටිතැන්න ප්‍රදේශයෙන් ගල්බොඩ ප්‍රදේශයෙන් තේ පැළ අරන් යනවා. මේ දිස්ත්‍රික්කයෙන් හැම තැනටම යනවා. සමිත ආටිගල මන්ත්‍රීතුමා කියනවා වගේ. එවැනි දිලීරයක් මේවායේ තිබෙනවා කියලා ප්‍රචාරය වුණොත් ඒ මිනිස්සුන්ගේ තේ ආර්ථිකය බිඳ වැටෙනවා. ඒ නිසා මේ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා තේ පර්යේෂණ ආයතනයේ පරීක්ෂණයක් කරලා මේ ගැන කටයුතු කරන්න කියන එක පැහැදිලිවම කියනවා. ඇත්ත වශයෙන්ම මෙතන පරස්පර දෙයක් තිබෙන නිසා . ඒවගේම අපි මතක් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි මේ යෝජනාවට සමගාමී වශයෙන් පසුගිය වකවානුවල නියඟය නිසා තේවලට විශාල වශයෙන් හානි වුණා. නියන් ආධාර දීලා තියෙනවා. සමහර තේ සමිති වලින් මේ නියන් ආධාර දීලා තියෙනවා. සමහර තේ සමිති වලින් නියන් ආධාර මේ කුඩා තේ වතු හිමියන්ට ලබලා දීලා නෑ. මේ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා තේ සහනාධාරය නොලැබූ යම් සමිති තිබෙනවා නම් එතන තේ පර්යේෂණ ආයතනය දැනුවත් කරලා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය දැනුවත් කරලා ඒ ආයතනවලටත් මේ තේ නියන් සහනාධාරය ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ගෞරවයෙන් මතක් කරනවා. ඒවගේම අපේ අකිල මන්ත්‍රීතුමා මතක් කළා තේ මිළ ගණන් වැඩිවෙලා තිබෙන්නේ මේ ආණ්ඩුව නිසා නෙමෙයි කියලා. හැබැයි අපි බොහොම කණගාටුයි තේ හතළිහට පනහට බහින කොට කිව්වා ආණ්ඩුවේ තමයි කියලා. එතකොටත් අර එතුමා කියන විදිහට ඩොලරයේ අගය ඔය ගණන්වල තමයි තිබුණේ. දැන් මාස

කීපයකට ඉස්සර. හැබැයි මේ එක පාර තේ ගණන් ගියහම කියනවා ඩොලරයේ අගය නැගපු හින්දා තමයි නැත්නම් රුපියල බාල්දුවීම කතා කරන භාෂාවෙන් කියනවා නම් රුපියල බාල්දුවීම මත තමයි මේ තේ මිළ ඉහළ ගිහිල්ලා තියෙන්නේ කියලා. ඇත්තටම මේක විහිළු සපයන කතාවක් වගේ. ඒක වෙන කොණයකින් ඉඳලා බැලීමක් වගේ. එහෙම සරල විදිහට සිද්ධ වියයුතු කාරණාවක් නෙමෙයි. බොහෝ දුරට තේ අමු දළු කිලෝ එක රුපියල් එකසිය පනහ දක්වා වැඩි වෙන්න ඉඩ තියෙනවා. අද ජී.එස්.පී. සහනය ලැබීමත් සමඟ ඒ යුරෝපයේ ආර්ථිකයට වෙළඳ පොළට අපිට අවතීරණයවීමට අපේ තියෙන හැකියාවත් එක්ක උඩරට තේ වලට ලොකු ඉල්ලුමත් එක්ක ඒවගේම අපේ මැද පෙරදිග කලාපයට පහතරට තේ සැපයීම තුළින් අපිට පුළුවන් වෙනවා මීට එහා ගිය මිළකට තේ අමු දළු කිලෝවක මිළ යයි කියලා අපේ විශ්වාසයක් තියෙනවා. දැන් අපේ පැතිවල රු.98/- ක් රු.99/- ක් වගේ ගෙවනවා. දෙනියාය පැත්තේ රු.110/-ක් රු.112/- ක්,රු.113/- ක් ගෙවනවා. එහෙම නම් ඩොලරය බලපානවා නම් අපි ඔක්කෝටම බලපාන්න ඕනේ. එහෙම හිතන එක අපි හරි නෑ. ඒක සුදුසු නෑ. විශේෂයෙන් අකිල වගේ මන්ත්‍රීවරයෙකුට කොහෙත්ම සුදුසු නෑ එතුමා ගැන අපි විශ්වාසයක් තියාගෙන ඉන්නේ. ඒවගේ අදහස් ප්‍රකාශ කිරීම තුළින්. ඒ නිසා රුපියල ඩොලරය සඳහා ගෙවිය යුතු මුදල ඉහළයාම නිසා ඇති වෙච්ච වෙනසක් නෙමෙයි විශේෂයෙන්ම යුරෝපයේ වෙළඳ පොළ මැද පෙරදිග වෙළඳ පොළ අපිට අවතීරණය කර ගන්න පුළුවන් වුණ නිසා තමයි විශේෂයෙන් අපිට පුළුවන්කම ලැබිලා තිබෙන්නේ ලෝකයේ විශ්වාසයක් දිනාගන්න පුළුවන් වෙලා තියෙනවා වර්තමාන රජයට. ඒ නිසා ඒ වෙළඳ පොළ අපිට විවෘත වෙලා තිබෙනවා.

ඒවගේම පොහොර ගැන කතා කළා. ඇත්ත වශයෙන්ම සහන පොහොර පහුගිය කාලයේ ලැබුණා. ලැබුණේ නැත්තේ නෑ. මමත් ඇත්තටම කුඩා තේ වතු හිමියෙක්. ඒ සහන පොහොර දැම්මහම දවස් 20 කට තෙක් ඔබතුමාට වැරදි තොරතුරක් ලැබිලා තියෙන්නේ. මට තියෙන්නේ අක්කර පහයි. නැද්ද. ඔබතුමා ව්‍යංගයෙන් ආවේ මගේ පැත්තට. ඔබතුමාගේ අක්කර සීයයට වැටෙන නිසා හැත්තෑපහක් විතරනේ තියෙන්නේ. ඔබතුමා හිතුවා අක්කර හැත්තෑපහක් විතර තියෙන නිසා කුඩා තේ වතුවලට වැටෙයි කියලා. ගරු සභාපතිතුමනි අක්කර සිය ගාණක් තියෙනවා කියලා හිතාගෙන ඉන්න එකත් ලොකු දෙයක්.

ගරු සභාපතිතුමනි තේ සහනාධාර යටතේ ඒ ලැබිච්ච පොහොරවලදී ඇත්තටම කඩන්න පුළුවන් දළු දවස් විස්සකට අඩු ගාණක්. ඒක දෙපාරයි තුන්පාරයි දළු එන්නේ. හැබැයි දැන් වර්තමානයේ එහෙම නෑ. සුදුසු පොහොර ටික අපිට ගන්න පුළුවන්. අපිට ඕනේ නම් ඒ පොහොර මිශ්‍රණය හදාගන්න පුළුවන්. අපිට තේ වගාව පිළිබඳව ඇල්මක් දක්වනවා නම් මීට වඩා ප්‍රමාණයකට ඒ මිළ ගියත් ඒ මිළ අපිට ආදායමක් හැටියට ලබා ගන්න අවකාශ තිබෙනවා. ඔබතුමාත් මම කියන්න ඕනේ නෑ විශාල තේ වතු ප්‍රමාණයකට අයිතිවාසිකම් කියන පවුලකට සම්බන්ධ. ඒ නිසා මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය වෙන්නේ නෑ. කෙසේ වෙතත් ඒ සම්බන්ධව අකිල මන්ත්‍රීතුමා මතක් කළ නිසා සිහිපත් කරමින් මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොකද එහෙම රෝගයක් ඒ කලාපයට වැළඳිලා තියෙනවා නම් ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කළ යුතුම

වෙනවා. මොකද ඒ ප්‍රදේශයේ තේ පැළ රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොව දකුණු පළාතට පවා ඒ තේ පැළ යනවා. හැබැයි අකිල මන්ත්‍රීතුමා කියපු විදිහට එහෙම නොවේ නම් ඒ ආර්ථිකයට ලොකු බලපෑමක් ඇති වෙනවා. ඒකත් හරි ප්‍රශ්නයක්. මොකද දවසකට ලොරි පනහක් විතර කියන්නේ පොඩි ගාණක් නෙමෙයි. ඒ නිසා ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලීම කරමින් මගේ වචන කීපය හමාර කරනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රහුබද්ධ*

*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*

*-------------------------------------------------------*

ගරු සභාපතිතුමනි මම අපේ මන්ත්‍රීතුමාට වාදයකටවත් මේ සම්බන්ධවත් කතා කරනවා නෙමෙයි. අකිල මන්ත්‍රීතුමා කිව්ව කාරණාව පිළිබඳව කාරණා ගණනාවක මම එකඟ නොවෙන කාරණා තියෙනවා. මම මේ සභාවේ නොසිටිය නිසා එතුමා කතා කළ බොහෝ දේවල් අපි කරුණු කියන්නට යන්නේ නෑ. නමුත් මිළ සූත්‍රය ගැන කිව්වහම සමහර තේ තියෙනවා ගරු සභාපතිතුමනි ඔබතුමාට කියන්නට ඕනේ නෑ රු.110/- ට ඒ දවස්වලත් ගියා තිර දෙක. තිර දෙකයි දල්ලයි ඒ කාලයේ රු.100/- ට ගියා. එහෙම වර්ගීකරණයක් තියෙනවා නැත්තේ නෑ. මොකද ඔබතුමා තියෙන ගාණම මටත් තියෙනවා තේ. රබර් මිළ මම දන්නේ නැනේ. ඒ නිසා අකිල ගරු මන්ත්‍රීතුමා කිව්වේ මෙතෙන්දී විවාදයකටවත් වෙනත් කාරණාවක් නිසා නොවේ. එහෙම ක්‍රමවේදයක් තිබුණා ඒ කාලයේ ගරු සභාපතිතුමා. අර ඩොලරය ගැන කතා කළ එතුමා ඒක දේශපාලනයක් අරගෙන කතා කරන්න ඇතිව නැතුව ඇති කියලා තමයි මම එහෙම කිව්වේ. සමහර තැන්වල තිබුණා. මේකෙදි සත්භාවයෙන් එතුමා කිව්වේ වර්ගීකරණය තිබුණා. ඒ නිසා ඒ කාලවලත් තේ මිළ ඒ අනුව ඒ වර්ගීකරණයට ගියා.

*ගරු සභාපති කංචන ජයරත්න*

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*

*Hon.Chairman Kanchana Jayarathna*

*----------------------------------------------------------*

ස්තූතියි ගරු ඇමතිතුමනි. මීළඟට පී.අබේනායක ගරු මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට ගරු මන්ත්‍රී බී.ආරියවංශ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*

*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------

*-------------------------------------*

ගරු සභාපතිතුමනි අපේ සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳ මේ සභාවේ ගරු මැති ඇමතිතුමන්ලා ,ගරු මන්ත්‍රීතුමන්ලා දීර්ඝ වශයෙන් කතා කළා. ඒ අවස්ථාවේදී මේ යෝජනාව පිළිබඳව මේ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඒවගේම තේ වගාව සම්බන්ධ ප්‍රදේශයක ජීවත් වෙන පුද්ගලයෙක් වශයෙන් මේ පිළිබඳව කරුණු කාරණා කීපයක් ඉදිරිපත් කිරීම තමයි මගේ අරමුණ. ඒ අනුව සමිත ආටිගල මන්ත්‍රීතුමා එතුමාට තේ පරීක්ෂක මහතුන් විසින් අද තේ වගාවට අත් වෙමින් පවතින ඉරණමක් පිළිබඳව තමයි ඒ දීර්ඝ විස්තරයක් කළේ.

එහිදී ඒ වටපණු රෝගය සම්බන්ධව ඒ තේ වගාවට වැළඳී ඇති රෝගය ව්‍යාප්තවීම වළක්වා ගැනීම සඳහා තමයි එතුමා ඒ යෝජනාව ඉදිරිපත් කළේ. එහිදී විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රදේශය තමයි විශාල වශයෙන් තේ තවාන් තේ පැළ බිහි කරලා ඒ රත්නපුර දිස්ත්‍රික්කයට අලුත් වගාවන් සඳහා යොමු කරන ප්‍රදේශයේ ඒ ප්‍රදේශයේ විශාල පිරිසක් මේ තේ තවාන් වලින් ජීවත් වෙන විශාල පිරිසක් ඉන්නවා. එම නිසා මේ තේ වගාව තුළ අද සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඒවගේම සෑම ප්‍රදේශයකට තේ පර්යේෂණ නිළධාරී පිරිසක් ඉන්නවා. එම නිසා මේ සියළු දෙනාම අද දන්නවා මේ වටපණු රෝගය පිළිබඳව ඒ සියළු දෙනාගේ දැඩි පරීක්ෂණයෙන් යුතුව මේ පස පරීක්ෂා කරලා මේ තේ පැළය සිටුවීම සඳහා අවශ්‍ය කරන ඒ අංකුරය ලබාගැනීමේ තේ ගහ හඳුනාගෙන ඒ සියළු දේවල් කිරීම තුළින් මේ රෝගය පැතිරයාම වලක්වා ගැනීමට හැකි වෙනවා කියලා අපිට කියන්න පුළුවන්. එම නිසා විශේෂයෙන්ම මේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේත් බහුලව තේ වගාව තියෙන්නේ. මේ තේ පරීක්ෂක නිළධාරීන් දැනුවත් කරලා මේ තේ පැළ සිටුවලා තේ කටයුතු කරන සියළු දෙනා දැනුවත් කරලා ඒ අයගේ අධීක්ෂණය යටතේ තේ පැළ බිහි කරලා ඒ තුළින් ගොවි ජනතාවට ලබාදීලා හොඳ තේ වගාවක් ඇති කිරීමට අවස්ථාවක් ලැබෙනවා. එම නිසා මේ වන කොට අපි දන්නවා තේ වගාව තුළ පසුගිය කාලය තුළ කම්කරුවන් හිඟතාවය නිසා මේ වල් නාශකවලට අපේ ගොවියන් ඇබ්බැහි වුණා. කුඩා තේ වතුකරුවන් ඒවගේම මහා පරිමාණයේ වැවිලිකරුවන් මේ හේතුව නිසා තමයි පසේ සිටින පසට හිතකර ජීවීන් ගැඩවිලා ඒ ඇතුළු ඒ පසේ ජීවත් වෙන ජීවීන් වල් නාශක යෙදීම තුළ දීර්ඝ කාලයක් විනාශයට පත් වුණා. ඒ තුලින් තේ වගාව අපි දන්නවා අක්කරයකින් කිලෝ 1200 ක් වගේ නෙළපු අක්කරයකින් පසුව මේ වල් නාශක යෙදීම තුළ 700 ට 800 ට තේ කිලෝ මාසයකට ලබා ගන්නා ප්‍රමාණය අඩු වුණා. ඒවගේ හේතූන් මත විවිධ හේතූන් මත ඒ තේ වල් නාශක පසුගිය කාලයේ තහනම් කළත් මේ වන කොට වෙළඳ පොළේ අධික මිළට හොරෙන් අලෙවි කරනවා. ඒ අලෙවි කිරීම තුළ සමහර අය ගෙනිහිල්ලා මේවා නැවත තේ වගාවට යොදලා තමන්ගේ වගාව විනාශ කිරීමේ තත්ත්වයට පත් වෙලා තියෙනවා. එම නිසා අපි දන්නවා කම්කරුවන්ගේ හිඟතාවය නිසා තමයි මේ සඳහා යොමු වෙලා තියෙන්නේ.

එම නිසා අපේ වගාවන් තුළ වසර පහක් හයක් ඒ නෙළලා ඒ තණ කොළ ටික පොහොර බවට පත් වුණොත් විශාල වශයෙන් තමයි ඒ තේ වගාවේ පස සරුවත් වෙලා හොඳ අස්වැන්නක් ලබාගැනීමට හැකි වෙනවා. ඒ නිසා විශේෂයෙන් මේ තේ පරීක්ෂක මහත්තුරුන් විශේෂයෙන් උනන්දු කරලා ඒ ප්‍රදේශවල තියෙන කුඩා තේ වතු ඒවගේම මහා පරිමාණයේ වතු ඒ සියල්ලක්ම දැනුවත් කරලා මේ වැඩ සටහන ගරු සභාපතිතුමනි මේ වතු ක්‍රියාත්මක කිරීම තුළ නැවත අපිට පුළුවන් වෙනවා මේ රටේ තියෙන මේ ප්‍රදේශයේ තියෙන තේ වගාව දියුණු කර ගැනීම සඳහා. ගරු සභාපතිතුමනි සමහර ෆැක්ට්‍රිවල තේ මිළ රු.110/- ට රු.115/- ට ගෙවනවා. සමහර ඒවා රු.100/- ට ගෙවනවා. ඒවගේ විවිධ ස්ථානවල විවිධ මිළ ගණන්වලට තමයි ඒ මිළදී ගැනීම් කරන්නේ . එහිදී විශේෂයෙන්ම අර සඳහන් කළා වගේ තේ දල්ලේ ප්‍රමාණය අපේ සඳහන් කළා වගේ කම්කරුවන් හිඟතාවය නිසා

කම්කරුවන්ට තේ වැඩි ප්‍රමාණයක් නෙළා ගැනීමේ කටයුතු කිරීම නිසා පිහි භාවිතා කර ඇදීම තුළ අද තේ වගාව විනාශ වෙලා යනවා. මේ පිළිබඳවත් විශේෂයෙන් තේ වගාකරුවන් තේ පරීක්ෂණ මහත්තුරුන් දැනුවත් කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් ඒවගේම සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව තුළ තේ වගාව අපේ මේ රෝගයෙන් බේරා ගැනීමටත් ඒවගේම මේ තේ වගා කටයුතු සඳහා දායකවන බලංගොඩ ප්‍රදේශයේ මේ තේ පැළ නිෂ්පාදනය කරන ගොවි මහතුන් බේරා ගැනීමටත් දෙකම කටයුතු කරලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා තේ පරීක්ෂණ මහතුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තූතියි බී.අරියවංශ මන්ත්‍රීතුමනි මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සඳහා වටපණු රෝගය නිසා විශාල හානියක් සිදුවී ඇත්නම් ඒක අපිට මේ බලංගොඩද වලේබොඩද ,පැල්මඩුල්ලද, මාතරද , හක්මනද ,බෙලිඅත්තද කියන එක වැඩක් නෑ ගරු සභාපතිතුමනි. එතුමා මේ කිව්වා ටී.ආර්.අයි. එක කියන්නේ හිඳැල්ලන තේ පර්යේෂණ ආයතනයේ නිළධාරීන්ගෙන් ලැබුණ තොරතුරක් ඒක. මෙන්න මේක ගැන තමයි ගරු සභාපතිතුමනි අර පැත්තට මේ පැත්තට බොලේ පාස් කරන්නේ නැතුව අපි වෙන්නට ඕනේ මම මේ යෝජනාවට එකතු කරනවා යෝජනා කරනවා මෙන්න මේ නිළධාරීන්ගෙන් වාර්තාවක් අපි වහාම ගෙන්වා ගත යුතුයි. මේ යෝජනාව අනුව. එහෙම නම් ඒ වෙන අකටයුතු සම්බන්ධව අපි කටයුතු කරන්න ඕනේ කියන මතය. පහුගිය ගංවතුරට සති තුනකට ඉස්සෙල්ලා අපි මේ ගරු සභාවේ කතා කළා . එදා අපි ලෑස්ති වෙලා හිටියා නම් මේ හානිය අවම කර ගන්නට තිබුණා. තේ කියන්නේ හදවත. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහම අතිවිශාලක් ජනතාවගේ පළවෙනි ආර්ථිකය වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි තේ. මේකට මේ වටපණු රෝගය කියලා එකක් වැළඳෙනවා නම් ඒකයි අරයාට මෙයාට බෝලේ පාස් නොකර වියයුතු කළයුතු වන්නේ මේ යෝජනාවේ වැදගත්කම වන්නේ තමුන්නාන්සේ තේ පර්යේෂණ ආයතනයෙන් මේකට වහාම වාර්තාවක් ගෙනල්ලා ඒ අදාල නිළධාරීන් වහාම දැනුවත් කිරීම තමයි රටට දැයට වැඩ කටයුතු කරන අයගෙන් වියයුතු වෙන්නේ. මෙන්න මේකයි ගරු සභාපතිතුමනි වෙන්නට ඕනේ. මම එකතු කරනවා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මේ තේ දල්ලට දෙන බර ගත්තහම මම සිරිපාගම පැත්තේ ගිහිල්ලා එන කොට කිව්වා අනේ පුතේ මම ගෙදරින් කිරාගෙන ආවා 82 ක් දැන් තියෙන්නේ 70 ක් කියලා. ලොරියට දාන කොට මෙන්න මෙතන මාපියාවක්

තියෙනවා ගරු සභාපතිතුමනි. ඒවගේම තේ දල්ලට දෙන මිළ ගත්තහම විවිධ ආයතන වලින් විවිධ මිළ ගණන්. මුදල වෙනස් කරනවා. ඒක ලොකු අසාධාරණයක් වෙලා තියෙනවා අහිංසක තේ දළු කඩන ව්‍යාපාරිකයාට. කම්කරුවාට. මෙන්න මේ දේ සංශෝධනය කරන්න වෙනවා ගරු සභාපතිතුමනි කොහොම හරි පළාත් සභාවෙන් පැනලා හරි මේ තේ දළු කිරන කොට ලොරිවල. හරි බැලන්ස් එකක් තියෙනවාද. මේක හරියට කෙරෙනවාද. මේ තේ දල්ලේ මිළ උපරිමය ගොවියාට ලැබෙනවාද. කියන එක බලනවා නම් මේ ගරු සභාවේ වගකීම අතිවිශාලයි වැදගත් වෙනවා ගරු සභාපතිතුමනි. මේ වියයුතු කළයුතු කාර්යයක් වෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*

*கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த*

*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

මේ වන කොට ඔබතුමා කියපු කාරණාව සමහර කර්මාන්ත ශාලා කරලා තියෙනවා. ඒ නිසා ඔබතුමා කියපු ආයතනය කේ.ඩී.යූ.සමූහ ව්‍යාපාරය. ඉලෙක්ට්‍රෝනික් තරාදිය දීලා තියෙනවා. ඒක අපිට අරහෙම කිව්වහම සමහර වෙලාවට ඒ ආයතනවලට අසාධාරණයක් සිද්ධ වෙනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*

*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*

*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

මේවා මේ ආවට ගියාට සභාවට ඇවිල්ලා දොඩවන දේවල් නෙමෙයි. මේවා හරියාකාරව බලලා තියෙනවා අසරණ තේ ගොවියා බටේවෙල පැත්තේ ඒ පැත්තේ මිනිස්සු කියනවා නම් බුදුඅම්මේ මම 82 ක් කිරාගෙන ආවා ගෙදරින්. කිරලා බලන කොට මෙතන 70 නම් 12 ක් අඩුනේ ගරු සභාපතිතුමනි. දෙන මුදල දෙනවා රු.70/-,රු.80/- රු.110/-යි. රු.115/- යි කියලා. නමුත් අදත් රු.60/- යි රු.65/- ලැබෙනවා තේ ගොවියෝ ඉන්නවා. මෙන්න මේ ගසාකෑම. සත්භාවයෙන් විවිධාකාරයෙන් සුපිරි කොටිපතියෝ මේ කරගෙන යන ව්‍යාපාර මෙවැනි ගසාකෑම් නැති වෙන්නට ඕනේ. නමුත් සමස්තයක් ගත්තහම අතිවිශාලයි වැරදි ගරු සභාපතිතුමනි. අසරණ ගොවියාගේ. මේ ගැන නවත්තන්නයි මම කියන්නේ. ඔබතුමා කියපු එක ඇත්ත. වැදගත් උදව්ය කරන්නේ නෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*

*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ඔබතුමා කියන්නේ ඕක නොකරන අයටත් ඒ වදිනවානේ. ඒ නිසා එතුමා පැහැදිලි කිරීමක් කළේ. යම් තැන්වල ඒක සිද්ධ වෙනවා ඇති. ඒක එහෙම වෙන කොට පොදුවේ අර නිවැරදිව කරන අයටත් ඒක යම්කිසි හානියක් වෙයි කියන එක තමයි එතුමා පැහැදිලි කළේ. ඔබතුමාට බාධාවක්

නෙමෙයි. ඔබතුමා කතාව කරන්න. මම පැහැදිලි කළේ ඒ කාරණාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

මොකද මම කියන්නේ මේක කරන අයට. ගරු සභාපතිතුමනි කසල තේ. කසල තේ, කසල තේ මේක කොච්චරවත් කතා කරනවා. අවුරුදු පහක් හයක් කතා කරනවා. මේ කසල තේ වලට 2015 ජනවාරි 08 වෙනිදාට ඉස්සෙල්ලා ගත් ක්‍රියාමාර්ගයක් මට පුළුවන් නම් පෙන්වන්න. දඩුවම් කළාද. හිරේ දැම්මද. දේපළ රාජසන්තක කළාද. නෑ. මේ රටේ තේ ටික පිටරට ගෙනිච්චහම වරක් බොනවා. දෙකක් බොනවා. තුනක් බොනවා. විශේෂයෙන් මැද පෙරදිග රට. ලෝකයේම රටවල් අපේ තේ ගන්නවා. තේ ප්‍රතික්ෂේප වුණේ බාල තේ හොඳ තේ වලට කලවම් කිරීම උඩ. එදා රු. 58/- තිබුණ දළු කිලෝ එක අද මේ රු.100/- ,110/-,115/-, වෙන්න හේතුව මොකද අතිගරු ජනාධිපතිතුමා යනවා. තුන් හාරසීයක් යන්නේ නෑ එක්කෙනයි දෙන්නයි යන්නේ. ගිහිල්ලා ඒ රටවල දැනුවත් කරනවා. අපේ තේ බීලා බලන්න. කසල තේ විනාශ කරනවා. හොඳ තේ දෙන්නේ මේවා බීලා බලන්න කියලා යනවා. ඊට පස්සේ අගමැතිතුමා යනවා .ඒත් දෙන්නයි තුන්දෙනයි යන්නේ. ඒවගේම අදාල ඇමතිවරයා යනවා. ඒ හැම රටකටම ගිහිල්ලා අපේ මේ පුංචි දූපතේ ශ්‍රීලංකාවේ තේ දැන් බීලා බලන්න. කසල තේ කලවම් නෑ දැන් හොඳ තේ එවන්නේ කිව්වහම ඒවා බීලා බලලා තමයි ගරු සභාපතිතුමනි රු.80/-,85/-,100/- ,110/- වෙලා තියෙන්නේ දළු කිලෝ එකක්.

මෙන්න මේවා ගැන අපි වැරැද්දක් පෙන්වනවා නෙමෙයි මේ වැරැද්ද නිවැරදි වෙන්නටත් ඒවගේ දේවල් නොවෙන්නටත් තමයි ගරු සභාපතිතුමනි මේ ගරු සභාවේ මම කිව්වේ මම සමස්තයකට ගැහුවේ නෑ. අර බැකෝ කරන කොට ගරු සභාපතිතුමනි යට තියෙන මාලාව ඒ ආකාරයටම යටට දාලා උඩින් ගන්නා පස ඒ ආකාරයටම සකස් කරලා කරපු අයට බැකෝ කාරයින්ට අපි දොස් කිව්වේ නෑ. බැකෝ දාලා පරිසරය විනාශ කරන අයටත් අපි එදාත් දොස් කිව්වේ. අදත් දොස් කියන්නේ. හෙටත් දොස් කියන්නේ. ඒ නිසා තේ ආයතන ගත්තහම තේ ක්ෂේත්‍රයේ යෙදෙන උදවිය ගත්තහම ඒ අයටත් අවනම්බුවක් කරනවා යම්කිසි පිරිසක් අර බර අඩුවෙන් කිරීමත්,අඩු මුදලක් ගෙවීමත් ගරු සභාපතිතුමනි. මෙන්න මේවා සකසා ගැනීම විශේෂයෙන්ම මම තමුන්නාන්සේට අවධානය යොමු කරන්නේ මේ යෝජනාව අද ඉතා වැදගත් යෝජනාවක්. මේ යෝජනාවේ වැදගත්කම තියෙන්නේ වටපණු රෝගය කොහේ හරි වැළඳුණා නම් ඒක උඩු දුවලා සුන්නත් දූවිලි වෙලා යනවා ගරු සභාපතිතුමනි. කුඹුරට කීඩෑවෝ ආවා වාගේ. මේක නැති කරන්නට තමුන්නාන්සේ මේ යෝජනාව අනුව තේ පර්යේෂණ ආයතනය හිදැල්ලන වාර්තාවක් ඉල්ල ගන්න. ඒ වාර්තාව අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් නෙමෙයි මුළු රටේම වෙලා තියෙන හානිය අවම කරන්නට තමුන්නාන්සේ කටයුතු කරන්න කියලා ඉල්ලමින් මගේ මේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. මේ වනවිට කෘෂිකර්ම ඇමති ශ්‍රීලාල් වික්‍රමසිංහ අමාත්‍යතුමා සභාවේ නැහැ. එතුමා අද සභාවේ නිවාඩු ඉල්ලලා නිවාඩු අනුමත කරලා තියෙනවා. එතුමා විසින් ඉදිරිපත් කරලා තියෙනවා එතුමා මේ කාරණාව පිළිබඳව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් කරන ලද විමසීමකට එවන ලද පිළිතුර මේ වන කොට සභා ලේකම්තුමියට එවලා තියෙනවා. මම ඒ ලිපිය සමිත ආටිගල මැතිතුමාට එවීමට කටයුතු කරනවා. ඒ ලිපියේත් යම්කිසි තොරතුරු සඳහන් වෙලා තියෙනවා. ඔබතුමාගේ මේ අද ඉදිරිපත් කරන ලද කාරණාව පිළිබඳව. මීළඟට විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමාට ආරාධනා කරනවා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමාට පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. ගරු සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා වැදගත් යෝජනාවක් ඉදිරිපත් අද කළා. ඒ යෝජනාවට අදහස් දැක්වීමට අවස්ථාවක් ලබාදීම ගැන. තේ නිෂ්පාදනය ගැන කියන කොට අද නිෂ්පාදනයට සාධාරණයක් නොවෙන ව්‍යාපාර වලින් සිදුවන හානිය ආටිගල මන්ත්‍රීතුමා පෙන්වලා දීලා තියෙනවා. දැන් අපි දන්නවා ලංකාව තුළ මොන දේ කළත් ලොකු සමාගම් වෙන්නට පුළුවන් සාමාන්‍ය ව්‍යාපාරිකයෝ වෙන්නට පුළුවන් සාමාන්‍ය නිෂ්පාදකයෝ වෙන්නට පුළුවන්. මේ හැම කෙනෙක්ම සාධාරණය අසාධාරණය දෙවිදිහටම වැඩ සිද්ධ වෙනවා. සාධාරණය තමුන්ගේ නිෂ්පාදන භාණ්ඩ වලට සාධාරණයක් ඉටු කරලා මහජනතාවට සාධාරණයක් වෙන්නට ඒ ව්‍යාපාර ආරක්ෂා වෙන්නට ආරක්ෂා කර ගන්නට කටයුතු කරනවා. සමහරු නමක් නැති ව්‍යාපාර කරන අය අද විශාල පිරිසක් ඉන්නවා. මුදල් සොයා ගැනීම සඳහා කොයි ආකාරයෙන් හෝ තමුන්ගේ නිෂ්පාදන කටයුතු කරලා ජනතාවට හෝ නැතිනම් ඉල්ලුම අනුව කටයුතු කරන්න අද ඒ අය සූදානම් වෙලා ඉන්නවා. මේ අනුව තමයි අද මේ තේ වගාව ගැන අපේ සමිත ආටිගල මැතිතුමා විස්තර කළේ. ඒ විස්තර කිරීම අනුව අපිට තියෙනවා සිරිපාල කිරිඇල්ල මැතිතුමා කිව්වා වගේ සමහර අය බර අඩුවෙන් කිරලා මුදල් දෙනවා කියන කතාව. මම ඒකයි කිව්වේ මොන සමාගමක් හෝ මොන ව්‍යාපාරියක් හෝ නම රඳවාගෙන තමුන්ගේ ආයතනය ආරක්ෂා කරගෙන යනවා වගේම නමක් නැති අය මොන දේ හරි කරලා මුදල් හම්බ කරන මාර්ග ඇති කරලා තියෙනවා. ඒ අනුව අපිට හිතන්න පුළුවන් මේ තේ වගාව අද ආරම්භ කරන අය සමහරවිට මේ පැළ නිෂ්පාදනය කරන අය සමහරෙක් එහි ප්‍රමිතිය ඇතුව කටයුතු කරන අය ඉන්න පුළුවන් විශාල පිරිසක්. ඒවගේම ප්‍රමිතියක් නැතුව මේ නිෂ්පාදනය කරන අය ඉන්නට පුළුවන්. එහෙම නම් ප්‍රමිතියක් නැතුව නිෂ්පාදනය කරන භාණ්ඩයක් නැති නම් මේ තේ පැළ බෙදා හරිනවා නම් අර කියාපු වටපණු රෝග හෝ නොයෙකුත් රෝග හෝ නැත්නම් මේ පැළය දුර්වලව හෝ තිබෙනවා නම් මේ වගාව විනාශයට පත් වෙනවා. මේ අනුව අපිට පෙන්වලා දීලා තියෙන්නේ තේ පර්යේෂණායතනයේ නිළධාරීන් කියන එක විවෘතව අපේ

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අපිට මේ ගැන සැකයක් නෑ එතුමා කියාපු ආකාරයට මේ අපි රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් නෙමෙයි තේ වගාව විශාල වශයෙන් කෑගලු දිස්ත්‍රික්කයේත් කෙරෙනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනේ. මේ වටපණු රෝගය මේක බෝ වෙලා වසංගතයක් වගේ ගියොත් තේ වගාව විනාශ වෙලා යන්නට පුළුවන්. ඒවගේම විදේශ විනිමය අද අපිට විශාල වශයෙන් ලැබෙන්නේ තේ වලින්. ඒ මොකද අපි දන්නවා පහුගිය කාලයේ අපිට යුරෝපීය රටවල් වලින් අපිට තීරු බදු අහිමි කරලා තිබුණා ඒවගේම නිෂ්පාදන භාණ්ඩ ඒ රටවල් වලින් අලෙවි කර ගන්න අපිට අවස්ථාවක් නැතුව ගියා. නමුත් වර්තමාන ආණ්ඩුව ලෝකයේ රටවල් සමග සාකච්ඡා කරලා තීරු බදු හරිතව විශාල භාණ්ඩ ප්‍රමාණයක් රාශියක් යවන්න අවස්ථාව සලසා දීලා තියෙනවා. ඒ එක්කම මේ තේ විශේෂයෙන් යුරෝපයේ රටවල් වලින් විශාල ඉල්ලුමක් තියෙනවා. ඒ ඉල්ලුම අනුව මිළ ඉහළ ගියා කියන එක තමයි මගේ මතය විදිහට ප්‍රකාශ කරන්නට පුළුවන්. ඒවගේම මේ සුළු ඉඩම් හිමියන් ආරක්ෂා කරන්න මේ අපේ ගරු මන්ත්‍රීවරු අදහස් දක්වපු ආකාරයට අපි කටයුතු කරන්නට ඕනේ. අපි දන්නවා මේ ඔක්කෝම කසල තේ ගැන කතා කළා හැම කෙනෙක්ම කියන කොට අපිට මේ කසල තේ අල්ලන පැති බලපුවහම තේ ගහක්වත් නැති තැන්වල තමයි කසල තේ තියෙන්නේ. පොල්ගහවෙල ආසනයේ නැත්නම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ වෙන කොට පස් පොළක වගේ මම දැනුවත්ව කසල තේ අත්අඩංගුවට අරගෙන තියෙනවා. ගබඩා කරපු තැන් අරගෙන තියෙනවා. මේක ජාවාරමක් හැටියට කෙරෙනවා. ඒක මධ්‍යම පළාතේ විශාල වශයෙන් කෙරෙනවා. මේ ජාවාරම්කාරයෝ හොයලා අල්ලලා කටයුතු කරනවා නම් කුඩා තේ වතු හිමියන්ට මීට වඩා ඉහළ මිළකට තමුන්ගේ දළු ටික අලෙවි කර ගන්න පුළුවන් කියන එක මම ප්‍රකාශ කරන්නට කැමතියි. මීට වඩා දීර්ඝ වශයෙන් කතා කරන්නේ නෑ. අපි විශේෂයෙන්ම අපේ රටට විශාල ධනයක් ලැබෙන විදේශ විනිමය ලබාදෙන මේ තේ වගාව ආරක්ෂා කර ගන්න අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ ඉහළට දැනුවත් කරන්න මේවගේ දේවල් සිදු වෙන නිසා පරීක්ෂා කරලා කටයුතු කරන්න කියලා තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ. ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

බොහොමත් ස්තූතියි ගරු විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමනි. සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2017/16 දරණ යෝජනාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ඒවගේම විපක්ෂයේත් විවිධ යෝජනා අදහස් ඒවගේම සංශෝධන විවිධාකාරයෙන් මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරපු ලැබුවා. මෙම කාරණාව රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව හැටියට අපිට ඉතාමත් වැදගත් ඉතාම කාලෝචිත ඒවගේම වඩා විමසිලිමත්ව සාකච්ඡා කළ යුතු කාරණාවක් කියන එක අපි මතක් කරන්නට ඕනේ. අපි ස්තූතිවන්ත වෙනවා මෙම ගරු සභාවට ඉතාම වටිනා අදහස් ඉදිරිපත් කරමින් මෙම ඉතාමත් වැදගත් වූ යෝජනාව පිළිබඳව සියළු දෙනාම සාකච්ඡා කිරීම පිළිබඳව. ඒ අනුව ඔබතුමන්ලාගෙන් සභාව තුළ සාකච්ඡා වූ කරුණු පිළිබඳව අදාල ආයතන අදාල බලධාරීන් ඒවගේම අදාල මේ පිළිබඳව කටයුතු කරපු ස්ථාන

සියල්ල වෙතම මේ පිළිබඳව දන්වා යවමින් මේ පිළිබඳව කඩිනම් විධිමත් පියවර ගන්නා බව මේ ගරු සභාව දැනුවත් කරනවා.

මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/17 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි අද විෂයභාර ඇමතිතුමා වශයෙන් ප්‍රධාන ඇමතිතුමා නැති නිසා ඊළඟ දිනයේදී මුලටම මේ යෝජනාව ගන්නා මෙන් කාරුණිකව ඉල්ලනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තූතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමනි. ඔබතුමාගේ ඉල්ලීම අනුව ඉදිරි සභාවේදී ඔබතුමාගේ යෝජනාව පළවෙනිම යෝජනාව හැටියට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

**සභාව කල් තැබීමේ යෝජනාව:**

*ගරු සභානායක අසෝක ජයවර්ධන*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017 ජුනි මස 27 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් ලබන ලෙස මා යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තූතියි ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමාට. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක නැඟිටලාම ඉන්නවා නමත් කියන්න කලින් ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා. මට වෙන නමක් කියන් විදිහකුත් නෑ සිරිපාල කිරිඇල්ල මැතිතුමා නැගිටල ඉන්නවා. සිරිපාල කිරිඇල්ල මැතිතුමාට ආරාධනා කරනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි මම මේ වැදගත් යෝජනාවක් කරන්නේ. හරි කණගාටුයි. මොකක්ද මේ පළාත්

සභාවේම වැඩ කරන කම්කරුවෙක්ගේ වැටුප කීයද ගෙවන්නේ කොන්ත්‍රාත්කරුවා. මේක කම්කරු කොමසාරිස්තුමා නියම කරපු මිළක් තියෙනවා. ඇයි මේ මිළ අපි හැමදාම මේ සභාවේ කතා කරනවා. අපි මේ ගරු සභාවේ ආරක්ෂක නිළධාරීන් ගත්තහම ඒ වැටුප වැඩි කරන්න කිව්වම වැඩි කෙරුවා. ඒකත් ඒකත් මේ හය මාසයක් අට මාසයක් කතා කරන්න වුණා. එතකොට මේ ශුද්ධ කරන මිනිස්සු ගත්තහම අන්ත අසරණ මිනිස්සුනේ. මේ මිනිස්සුන්ට ඇයි මේ රුපියල් පන්සීය දෙන්න දෙන්නේ. මේ කොන්ත්‍රාත්කාරයාට ගසා කන්නට දෙන්නට එපා .අසරණ මිනිහා නහා සිටුවනවා නම් කම්කරු කොමසාරිස් නියෝග කරලා තියෙනවා නම් වැටුපක් ගෙවන්නට කරුණාකරලා අන්න ඒ වැටුප ගෙවන්න ලෑස්ති කරන්න ගරු සභාපතිතුමා. මේ බලන්න මේ විදිහට ලියුම් දීලා තියෙනවා 11 ක්. තමුන්නාන්සේගේ වැඩ කටයුතු කාරක සභාවේ කිව්වා. විවිධාකාරයෙන් එහාට මෙහාට ඇරියා. හරි ගියේ නෑ. මම මේ ගරු සභාවේ කියන්නවීම ගැන කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි. මේ අහිංසක මිනිස්සුන්ට අවුරුදු හතක් වැඩ කරලාත් දෙන්නේ රු.500/- යි. මේක කරන්නට දෙන්නට එපා. පළාත් සභාවට අපහාසයක්. පළාත් සභාවේම වැඩ කරන කම්කරුවාට කම්කරු කොමසාරිස් කියන එක නොදෙනවා නම් අපි නිකන් ඇඳුම් අඳින එකෙත් වැඩක් නැති වෙනවා ගරු සභාපතිතුමනි. මෙන්න මේ ගැන තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කරන්න.

ඊළඟට ගරු සභාපතිතුමනි පහුගිය ගංවතුර වෙලාවේ ඇසින් දැකපු දේවල් යම් යම් පළාත්වල , යම් යම් පළාත්වල ඔරුවල බෝතලයක් දෙකක් දාගෙන වුන් එකේ සිගරට් පැකට් එකක් අරගෙන කුකුළෙක් රෝස්ට් කරගෙන මුළු ගංවතුරේම සංචාරය කරපු ඇවිඳපු උදවිය ඉන්නවා. මේ පළාත් සභාවෙන් දීපු ඔරු. මට මෙතන වැදගත් වෙන්නේ අදාල ඇමතිවරයා රංජිත් බණ්ඩාර ඇමතිතුමා හිටියා නම් තමයි ගරු සභාපතිතුමා. මෙන්න මේ ඔරු අඟුල් දෙන කොට අපි එදා කිව්වා යෝජනාවක් කළා මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් හරහායි ලබා දෙන්නේ කියලා. නමුත් එදා කියාපු විදිහට ක්‍රියාත්මක වෙලා නෑ කියලා හිතාගෙන තමයි මම මේ සභාව කල් තබන අවස්ථාවේ ගරු සභාපතිතුමනි කියන්නේ. මම මේ ඔරු පහක් ඉල්ලලා තියෙනවා. අපිට මේ වුන් එකේ ඇවිදින්න නෙමෙයි. අසරණ ජනතාව පහුගිය කාලයේ තුන්වේල, හතර වේල කන්න නැතුව හිටියා. කන්න නැතුව හිටියේ අදාල තැන්වලට ඔරු අඟුල් නොදීම හේතුවෙන් . මෙන්න මේ නිසා ඔරු දෙන කොට පක්ෂග්‍රාහී වෙන්නට එපා දෙන කොට කොළ,නිල,රත බලන්නට එපා. වුවමනා තැනට යැවෙන්නට ඕනේ. ප්‍රාදේශීය ලේකම් හරහා විය යුතුයි. පෙළක් ග්‍රාම නිළධාරීන් මේකෙන් විවිධ දේවල් කළා. කසිප්පු තියෙන තැන්වලට ගියා ඒවෙන් ජොලියේ ගිහිල්ලා කෑවා. විවිධ දේවල් කළා. මම එක්කෙනෙකුට දෙන්නෙකුට චෝදනා කරනවා නෙමෙයි. මේ ගැන හොයන්න තමයි අපි දිසාපතිවරු පත් කරලා තියෙන්නේ. සහකාර දිසාපති මෙන්න මේගොල්ලෝ හරහා මෙන්න මේවා ලබාදීමේ කටයුතු වැදගත් විදිහට කරන්නය කියලා මම ඉල්ලනවා ගරු සභාපතිතුමනි.

ඒවගේම පළාත් සභාවේ මන්ත්‍රීවරු ගැන කතා කළා. කතා නොකරම බෑ. මම කාරණා තුනකට ඔබතුමාගෙන් වෙලාව ඉල්ල ගත්තේ. පළාත් සභාව ගත්තහම පළාත් සභාව එන්න ඉස්සෙල්ලා

87 වැඩ වසම් යුගයේ ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කරේ ලේන්සුව බිමට ගන්නට ඕනේ. සරම කහපොට බිම දාන්න ඕනේ. සීරුවෙන් ඉන්නට ඕනේ. ඒ තත්ත්වය නැති කරලා බලය විමධ්‍යගතවීම තුළින් ගරු සභාපතිතුමනි අසරණ ජනතාවට පළාත් සභාව හරහා වෙච්ච සේවය අතිවිශාලයි. මේක කියලා නිම කරන්න බෑ. පක්ෂයේ විපක්ෂයේ ඉන්න හැම කෙනාම බලන්නේ තර්ක කරන්නේ අනේ අතුල කුමාර ඇමතිතුමනි මටත් ලක්ෂ දෙකක් පාරට දෙන්න කියලා ඉල්ලන්නේ. මේ ඊගාව පාරටත් එන්නට. ඊගාව පාරටත් එන්න තරඟ කරන්නේ ගරු සභාපතිතුමනි අතිවිශාල සේවයක් මේ ජනතාවට වෙනවා. ඒ නිසා පළාත් සභාව හෑල්ලු නොකර පළාත් සභාවෙන් වෙන සේවය අතිවිශාලයි කියන එක එහෙම කරන උදවිය දැනුවත් කරන්න කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලමින් මට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාට. ඔබතුමා විසින් පළවෙනියම ඉදිරිපත් කරපු කාරණාව පිළිබඳව ඒ කාරණා කටයුතු කරන්නේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ලේකම්තුමා හරහා. ඒ පිළිබඳව ප්‍රධාන ඇමතිතුමා දැනුවත් කරමින් ප්‍රධාන ලේකම්තුමා වෙත දන්වා යවමින් අවශ්‍ය කටයුතු කිරීමට විධිමත් පියවර ගැනීම සඳහා කරුණු දැනුම් දෙන බව දන්වා සිටිනවා.

ඒවගේම ඔබතුමා විසින් ඉදිරිපත් කරපු දෙවෙනි කාරණාව ඔරු අභුල් කාරණාව පිළිබඳව ඔබතුමාත් මමත් අපි දෙන්නාම පහුගිය කාල සීමාව තුළදී මේ අවස්ථාවේදී පහුගිය ගංවතුර,නාය යෑම් විවිධ අවස්ථාවලදී අපි මූණ ගැසුණා. ඒ අවස්ථාවේදී මගේ කණටත් ඔය කාරණාව අවස්ථාවල් වතාවල් කීපයකදීම අහන්නට ලැබුණා පුද්ගලයෝ වශයෙන් අහලා ඒ ඒ අය කියලා නොකිය වුණාට මේ මේ කටයුතුත් සමහර අවස්ථාවල සිද්ධ වුණා කියලා. ඒ නිසා ඔබතුමා ඉතා හොඳ යෝජනාවක් ගෙනාවේ. මේ වෙලාවේ විෂයභාර අමාත්‍යවරයා නොහිටියත් මා මේ පිළිබඳව මීට ඉහතදීත් දැනුවත් කළා. ඒ නිසා ඉදිරි කාලවලදී මේවා නිවැරදි කරලා මේ කටයුතු ඉෂ්ඨ කරන්න කියලා දැනුවත් කරනවා. ඒවගේම පහුගිය කාල සීමාව තුළ ගරු පළාත් සභා මන්ත්‍රීතුමන්ලාගේ කාර්යය භාරය පිළිබඳවත් ඒ අයගේ ගරුත්වය කෙළසන ආකාරයට කටයුතු නොකරන ලෙසත් ඒ අයගේ ගරුත්වය රැකෙන ආකාරයට ඒ අයට තවත් ශක්තියක් වෙන ආකාරයට කටයුතු කරන ලෙසත් අදාල බලධාරීන් අදාල ආයතන දැනුවත් කරන බවත් දැනුම් දෙනවා. මීළඟට ගරු ආරියවංශ බාසූරිය මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*
*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------
--------------------------------------

ගරු සභාපතිතුමනි සභාව කල් තබන අවස්ථාවේදී යෝජනා ඉදිරිපත් කිරීමේදී මාගේ හදිසි යෝජනාවක් වශයෙන් ඉතාමත් වැදගත් යෝජනාවක්

ඉදිරිපත් කරන්නට ඕනේ. ඇඹිලිපිටිය කොලොන්න කලාපයේ මෙන්ම බොහෝ

ප්‍රදේශවල ප්‍රධාන සුළු අපනයන භෝගයක් ලෙස ගම්මිරිස් වගාව හඳුන්වා දිය හැක. බොහෝ පිරිසකගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ගම්මිරිස්වල මිළ පහත වැටෙමින් පවතී. එබැවින් මේ පිළිබඳව අවධානය යොමු කර ගම්මිරිස මිළ ඉහළ නන්වා පැන නැගී ඇති ගැටළුව නිරාකරණය කළ යුතුව ඇත.

ගරු සභාපතිතුමනි මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්නට ඕනේ. පසුගිය 2014,2015,2016 වර්ෂවලදී ගම්මිරිස් මිළ රු.1300/- දක්වා ගිහිල්ලා තිබුණා. මේ වර්ෂය වන කොට රු.850/- ,රු.900/- දක්වා වියළි ගම්මිරිස් කිලෝවක මිළ අඩු වෙලා තියෙනවා. ඒවගේම තමයි අමු ගම්මිරිස් කිලෝ එකක් රු.180/- දක්වා අඩු වෙලා තියෙනවා. මොකද රු.400/- ට පහුගිය වර්ෂවල ගියා. ඒවගේම මේ වන කොට මේ සෑම ප්‍රදේශයකම රත්නපුර දිස්ත්‍රික්කයේත් ඒවගේම කෑගලු දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්කවල මේ වන කොට බහුල වශයෙන් ගම්මිරිස් ගොවීන් ඉතාම අසීරුතාවයට පත් වෙලා තියෙනවා. ගම්මිරිස් අලෙවි කිරීමට නොහැකිවීම තුළ. එම නිසා විශේෂයෙන්ම අවධානය යොමු කරන්නට ඕනේ. මේ වන කොට අපිට දැන ගන්න ලැබිලා තියෙනවා වියට්නාමයෙන් ගම්මිරිස් මේ රටට ගෙන්වලා තියෙනවා. ඒවගේම පසුගිය කාලය තුළ හොර රහසේ ගෙන්වලා අඩු මිළට වෙළඳ පොළට මේ ගම්මිරිස් නිකුත් කිරීම තුළ අද ව්‍යාපාරිකයෝ පවා ගම්මිරිස් මිළදී ගැනීමට ඉතාම බියක් දක්වනවා. මොකද අපේ රටේ තියෙන ගම්මිරිස් හොඳ ප්‍රමිතියක් තියෙන ගම්මිරිස් තියෙන්නේ. ඉතා සැර අධික. ඒවගේම වියට්නාමයේ තියෙන ගම්මිරිස් ප්‍රමිතියක් නැති ගම්මිරිස්. ඒවා මිළ අඩුවෙන් මේ රටට ගෙනල්ලා මේ වන

කොට වෙළඳ පොළට නිකුත් කරමින් තිබෙන බව දැනගන්න ලැබිලා තිබෙනවා. මොකද මේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ගම්මිරිස් ව්‍යාපාරිකයෙක් වශයෙන් කටයුතු කරන නිසා අපිට දැන ගන්න ලැබිලා තියෙනවා අපෙනුත් අහලා තියෙනවා මේ ගෙන්වන ගම්මිරිස් මිළදී ගන්න ලබා දෙන්න කියලා. ඒවගේ තත්ත්වයක් උඩ අද රත්නපුර දිස්ත්‍රික්කයේ ඉන්න ගොවි ජනතාව ඉතාම අසීරුතාවයට පත් වෙලා තමන්ගේ අස්වනු නෙළලා වෙළඳ පොළට නිකුත් කිරීමට නොහැකි තත්ත්වයට ගරු සභාපතිතුමනි අද පත් වෙලා තියෙනවා. එම නිසා ගරු සභාපතිතුමනි මේ පිළිබඳව අවධානය යොමු කරන්න. මොකද පසුගිය වර්ෂවල අස්වැන්න අඩුවෙන් ලැබුණේ. මේ වර්ෂයේදී සෑම ඉඩමක වගේම විශාල අස්වැන්න ලැබිලා තිබෙනවා. ගොවින්ට මේ අස්වැන්න වසර ගණනකට පසු ලැබුණු මේ අස්වැන්න නෙලාගෙන වෙළඳ පොළට ඉදිරිපත් කරලා හොඳ මිළක් ලැබීමට හැකි වන පරිදි කටයුතු කරලා දෙන්න. ඒවගේම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සුළු අපනයන භෝග සම්බන්ධ කටයුතු කරන අපේ දයා ගමගේ ඇමතිතුමා විශේෂයෙන් දැනුවත් කරන්න මොකද මේ වියට්නාමයෙන් ගෙන්වන ගම්මිරිස් මේ රටට ගෙන්වීම තුළ අපේ රටේ පරිභෝජනයට වඩා විශාල නිෂ්පාදනයක් අපේ රට තුළ තිබෙනවා. මේවා අපේ රටේ ඉතිරිය අපේ රටට තිබිලා විශාල මුදලක් ලබා ගන්න තියෙන තැන අද ඇහිරිලා තිබෙනවා. මොකද අපි උදාහරණයක් කිව්වොත් පසුගිය කාලයේ කරුංකා ලංකාවට ගෙන්වලා මිළ ඉතාම අඩුවට ලැබුණේ. ගෙනල්ලා මේ භෝග මේ රටේ හොඳ භෝග සමඟ මිශ්‍ර කරලා වෙනත් රට

වලට යාම තුළ ඉතාම අඩු මුදලක් තමයි ලැබුණේ. එම නිසා මේ වගාව සඳහාත් මේ සිද්ධියම තමයි සිදු වෙමින් පවතින්නේ. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු

සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)

කරන්න කියලා මම අදාල තැන්වලට දැනුවත් කරන්න කියලා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි ගරු බී.ආරියවංශ මන්ත්‍රීතුමාට. මීළඟට ගරු රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා. එතුමාත් සභාවේ නැහැ.

දැන් වේලාව මධ්‍යාහ්න දොළහ පසුවී විනාඩි තිස්හතරයි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2017 ක්වූ ජූනි මස 27 වෙනිදින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අ/කලේ:

කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ ජූනි මස 20 වෙනි දින,